# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,004 - 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2017.01.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 3104 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | — | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | — |


**සැ. යු.** - අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත් කෙටුම්පත 2017 ජනවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 පෙබරවාරි මස 17 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීගමුව මහා නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා විවෘතව බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර 2017.02.27 දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

| *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *සටහන* |
|---|---|---|---|
| පුස්තකාල සහායක | 111 | 02 | 01 |
| සුසාන භූමි භාරකරු | 111 | 01 | 01 |
| කාර්යාල කාර්ය සහායක | 111 | 01 | 02 |
| සෞඛ්‍ය පරිපාලක | 111 | 01 | 03 |

***සටහන 01***

**වැටුප් ක්‍රමය** :- PL-1-2016 (රු.24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410)
(ආරම්භක වැටුප් පියවර රු. 24,250වේ.)

**අධ්‍යාපන සුදුසුකම්** :- අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතු ය.)

**වයස** :- අවම සීමාව - අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතු ය.

උපරිම සීමාව - අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සාමාර්ථ ලබාගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙක (02) ක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ. | 20 | |
| සාමාන්‍ය සාමාර්ථයකට ලකුණු - 04<br>සම්මාන සාමාර්ථයකට ලකුණු - 06<br>අධි සම්මාන සාමාර්ථයට ලකුණු - 08<br>විශිෂ්ඨ සම්මානයට ලකුණු - 10 | | 50% |
| ජාත්‍යන්තර හා ජාතික මට්ටමේ කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය. | 75 | |
| පෞරුෂත්වය (සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම.) | 05 | |

*සටහන 02*

**වැටුප් ක්‍රමය** :- PL-1-2016 (රු. 24,250-10x250-10x270-10x300-12x330-රු. 36,410)
(ආරම්භක වැටුප් පියවර රු. 24,250 වේ.)

**අධ්‍යාපන සුදුසුකම්** :- අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම. (මින් විෂයයන් පහ (05) ක් එකවර සමත් විය යුතුය.)

**වයස** :- අවම සීමාව :- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව :- අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය** :- සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ. පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙල අනුව පත්වීම කරනු ලබයි.

*සටහන 03*

**වැටුප් ක්‍රමය** :- MN-1-2016 (රු. 27,140-10x300-11x350-10x495-10x660-රු. 45,540)

**අධ්‍යාපන සුදුසුකම්** :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම,

සහ

අධ්‍යන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**වයස** :- අවම සීමාව :- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු විය යුතුය.
උපරිම සීමාව :- අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය** :- 01. ලිඛිත විභාගයක් මගින්

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 100 | 40% |

සටහන :- ලකුණු ලබා ගැනීමේ අනුපිළිවෙල අනුව වැඩි ලකුණු ලබාගත් අයගෙන් පුරප්පාඩු පුරවනු ලැබේ.

02. *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :*

මෙහි දී ලකුණු ලබා දෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.

**කායික සුදුසුකම්** :- සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**වෙනත්** :- i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම

ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු වීම
iii. යහපත් චරිතයකින් යුක්ත වීම
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**තනතුරෙහි ස්වභාවය** :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

පත්වීම ලබා වසර පහක් ඉක්මවීමට පෙර අංක 01/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදළ භාෂා ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක මුදල් ගෙවිය යුතුය.

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :-**

තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කළ බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද, ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද, අනුව කටයුතු කළ යුතුය.

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :-**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්යය පටිපාටික රීති වල දක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කෙරෙනු ඇත.

නාගරික කොමසාරිස්,
මීගමුව.

මීගමුව නගර සභාව

........................................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

1. මුලකුරු සමග නම :——————————
2. සම්පූර්ණ නම :——————————
3. ඉල්ලුම්කරන තනතුර :——————————
4. ජාතික හැඳුනුම්පත් අංකය :——————————
5. ස්ථිර පදිංචි ලිපිනය :—————————— දුරකථන අංකය :——————
6. තැපැල් ලිපිනය :——————————
7. ස්ථිර පදිංචි ලිපිනය :——————————
8. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :——————————
9. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :——————————
10. උපන් දිනය :——————————
11. 2017.02.27 දිනට වයස :——————————
12. අධ්‍යාපන සුදුසුකම් :——————————
(ඡායා පිටපත් ඇමිණිය යුතුය.)
13. පළපුරුද්ද :——————————
14. වෘත්තීය සුදුසුකම් :——————————
(ඡායා පිටපත් ඇමිණිය යුතුය)
15. වෙනත් සුදුසුකම් :——————————
16. ඔබ කවරදක හෝ උසාවියකින් වරදකරු කර තිබේ ද? යන වග :-

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවාගැනීමෙන් පසුව හෙළිදරවු වුවහොත් සේවයෙන් පහකිරීමටත්, යටත්වන බව හොඳාකාරවම දනිමි.

දිනය :————————        ————————
අයදුම්කරුගේ අත්සන

01-822

---

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව

අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *නාමය* | *තනතුරු ගණන* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | රා.පරි.ච.03/2006 අනුව PL-1 2006A 24250-10 x 250-10-270- 10 x 300-12 x 330 36140/- (රා.පරි.ච. 3/2016 උපලේඛනය II අනුව වැටුප් ගෙවනු ලැබේ) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06 ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05 ක් එක් වරකදී සමත්ව තිබිය යුතුය. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 03 | රා.පරි.ච.03/2006 අනුව PL-1 2006A 24250-10 x 250-10-270- 10 x 300-12 x 330 36140/- (රා.පරි.ච. 3/2016 වැටුප් ගෙවනු ලැබේ) | - එම - |

(05) බඳවා ගැනීම සඳහා වන අනෙකුත් පොදු සුදුසුකම් හා කොන්දේසි

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
(ii) අයදුම්කරු අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.
(iii) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
(iv) සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමකින් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.
(v) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් නොලැබූ වුවෙකු විය යුතුය.
(vi) බඳවා ගැනීම සඳහා අවශ්‍ය ඉහත සඳහන් සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

(vii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී මෙම බඳවා ගැනීමේ ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

(06) සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, තේරී පත්වන අයදුම්කරුවන් වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(ii) පත්වීමේ දින සිට වසර 03 ක කාල පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුළදී, වැඩ, පැමිණීම හා හැසිරීම, සතුටුදායක වේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවය ස්ථිර කරනු ලැබේ.
(iii) රා.පරි.ච.ලේ. අංක 01/2014 අනුව පත් වීමේ දින සිට වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අමතරව අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතා මට්ටම ලබා ගත යුතුය.

(07) අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලි වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) ජාතික හැඳුනුම්පතේ පිටපත
(iv) මෑතකදී ලබාගත් ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද පදිංචි සහතිකය
(v) අධ්‍යාපන සහතිකවල පිටපත්
(vi) වෙනත් සුදුසුකම් දක්වෙන සහතික වල පිටපත්

(08) අයදුම්පත් ඉදිරිපත් කිරීම

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පත් සම්පූර්ණ කර '' ලේකම්, අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව, ගුරුබැබිල, මැටිහක්ක'' යන ලිපිනයට 2017.03.17 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමන් ඉල්ලුම්කරන තනතුර සඳහන් කර එවිය යුතුය.

කේ. ජී. චන්ද්‍රසිරි,
ලේකම්,
අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව.

2017 ජනවාරි මස 10 වැනි දින,
අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව,
ගුරුබැබිල, මැටිහක්ක.

**අඹන්ගඟ කෝරළේ ප්‍රාදේශීය සභාව**
**ආදර්ශ අයදුම් පත්‍රය**

***මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ .............................. තනතුර සඳහා අයදුම්පත***

(01) (i) මුලකුරු සමග නම :——————————————
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————————

(02) (i) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————
(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————

(03) ස්ථිර ලිපිනය :——————————————
(04) ජාතික හැඳුනුම්පත් අංකය :——————————————
(05) ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————
(06) උපන්දිනය :———— අවුරුද්ද :———— මාසය :———— දිනය :————
(07) 2017.02.15 දිනට වයස : අවුරුදු :———— මාස :———— දින :————
(08) විවාහක/අවිවාහක බව :————

(09) අඹන්ගඟ කොරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :——————
(10) ජාතිත්වය :——————
(11) ශ්‍රී ලාංකික පුරවැසියෙක් ද? එසේනම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග :——————
(12) අධ්‍යාපන සුදුසුකම්:——————
(සහතික වල පිටපත් ඇමිණිය යුතුය)

(13) (i). වෙනත් සුදුසුකම් :——————
(ii). වෘත්තීය සුදුසුකම් :——————
(iii). සේවා පළපුරුද්ද :——————

(14) ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය හා විස්තර පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික) ආදී වශයෙන් :-

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට මා නුසුදුසුසෙකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දන්නෙමි.

දිනය :- ......................................

................................................
අයදුම්කරුගේ අත්සන

දැනටමත් රාජ්‍ය සේවයේ / පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන ............................................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ .................................................................. වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරා ගත හොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අයදුම්පත නිර්දේශ කරමි./ නොකරමි.

..................................................
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :——————
පදවි නාමය :——————
දෙපාර්තමේන්තුව/ආයතනය ::——————
(නිළ මුද්‍රාව තබන්න)

දිනය::——————

01-957

---

# පළාත් පාලන නිවේදන

## බණ්ඩාරවෙල මහා නගර සභාව

### බණ්ඩාරවෙල මහා නගර සභාව සතු උද්‍යාන පාර '' විලිෆ්‍රඩ් රත්නායක මාවත'' ලෙස නම් කිරීම

1947 අංක 29 දරන මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරිය) අංක 71 (1) වන වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම මහා නගර සභාව සතු උද්‍යාන පාර '' විලිෆ්‍රඩ් රත්නායක මාවත'' නමින් 2017 වර්ෂයේ පෙබරවාරි 01 දින සිට නම් කිරීමට කටයුතු කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. අද්දරවත්ත
නාගරික කොමසාරිස්
බණ්ඩාරවෙල මහා නගර සභාව

2017 ජනවාරි මස 10 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභා කාර්යාලයේ දී ය.

01-915

## වවුනියා උතුර ප්‍රාදේශීය සභාව

### මාර්ගයන්හි නාම ප්‍රකාශයට පත්කිරීම

1987 වසරේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියා උතුර ප්‍රාදේශීය සභා ලේකම්තුමා විසින් 2016.05.16 වන දිනැති අංක 89 දරන තීරණයට අනුව වවුනියා උතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මධ්‍ය තුළ පිහිටා ඇති වවුනියා උතුර ප්‍රාදේශීය සභාවට අයිතිය ඇති මාර්ග 2016.08.05 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* ත්‍රිවිධ භාෂාවලින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

දැනට 1987 වසරේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය අනුව වවුනියා උතුර ප්‍රාදේශීය සභාවෙන් හඳුනා ගත් මාර්ග සම්බන්ධව කිසිදු පැමිණිල්ලක් නොලැබීම නිසා මෙම මාර්ගයෙන් වවුනියා උතුර ප්‍රාදේශීය සභාවට ඇති අයිතිය තහවුරු කරන බව මෙයින් ප්‍රසිද්ධ කර දන්වා සිටිනු ලැබේ.

ලේකම්,
වවුනියා උතුර ප්‍රාදේශීය සභාව,
නෙඩුන්කේණි.

2017 ජනවාරි මස 05 වැනි දින.

01-787

---

## තුම්පනේ ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂය සඳහා ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් විසින් ඔවුන්ගේ නම් ඉදිරියෙන් දැක්වෙන ස්ථානවල එළගව මස් වෙළෙඳසලක් පවත්වාගෙන යාමට ගෝ ඝාතක ආඥාපනතේ 07 (1) වැනි වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කරන ලෙස තුම්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් වන මා වෙතින් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ තිබේ.

ගෝ ඝාතක ආඥාපනතේ 07 (2) වැනි වගන්තියට අනුව පහත උපලේඛනයේ සඳහන් ස්ථානවල එළගව මස් වෙළෙඳසලක් පවත්වාගෙන යාම වෙනුවෙන් බලපත්‍රයක් නිකුත් කිරීමට විරුද්ධතාවයක් දක්වන්නන් වෙතොත් එසේ විරුද්ධත්වය දැක්වීමට හේතු සඳහන් කරමින් මේ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දිනයේ සිට සති 02ක් ගෙවීමට මත්තෙන් පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදෙන ලෙස තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්හට මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. එස්. ඩී. පතිරණ
ලේකම්,
තුම්පනේ ප්‍රාදේශීය සභාව.

2017 ජනවාරි මස 04 වනි දින,
ගලගෙදර
තුම්පනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *ඉල්ලුම්කරුගේ නම* | *ගව මස් වෙළඳසැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය* |
|---|---|
| 01. ඒ.කේ.එම්. රිස්වාන් මයා. | බෙට්ටියගොඩ, කහපත්වල |
| 02. එස්.එම්. රියාස් මයා. | අංක 67/1, දෙහිදෙනිය, මඩිගේ, හතරලියද්ද |
| 03. එම්.එෆ්.එම්. රිෆාක් මයා. | අංක 367, රඹුක්කන පාර, මඩිගේ, ගලගෙදර |
| 04. එම්. එස්. එම්. නජීම් මයා. | අංක 319, රඹුක්කන පාර, මඩිගේ, ගලගෙදර |

01-959

## මීගමුව මහා නගර සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනතේ (272) අධිකාරි 17 දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නිසි බලධාරියා වශයෙන් මීගමුව මහා නගර සභාව වෙනුවෙන් නාගරික කොමසාරිස්, බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි වන කිරිහාමි සාදිරිස්ගේ චමින්ද සුගත් කුමාර 2017 වර්ෂයේ දී පහත උපලේඛනයේ සඳහන් දිනවලද පළාත් සභාව සහ මධ්‍යම රජය විසින් ඉදිරියේ දී අවස්වෝචිත ලෙස ප්‍රකාශ කළ දින වලද මීගමුව නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම, මස් වෙළෙඳාම් කිරීම හා මස් කඩ විවෘතව තැබීම සම්පූර්ණයෙන් තහනම් බව දන්වා සිටිමි.

කේ. එස්. සී. සුගත් කුමාර,
නාගරික කොමසාරිස්,
මීගමුව මහ නගර සභාවේ,
බලතල, කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි.

2017 ජනවාරි මස 06 වැනි දින,

### උපලේඛනය

| | |
|---|---|
| 2017. 01. 12 | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 02. 04 | ජාතික නිදහස් දිනය |
| 2017. 02. 10 | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 03. 12 | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 04. 10 | බක් පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 05. 10 | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 05. 11 | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දින |
| 2017. 06. 08 | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 07. 08 | ඇසළ පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 08. 07 | නිකිණි පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 09. 05 | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 10. 04 | ලෝක සත්ත්ව දිනය |
| 2017. 10. 05 | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 11. 03 | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| 2017. 12. 03 | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

01-849

---

## පස්ගොඩ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පස්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

රණවකගේ දිනූෂා ලක්මාලි,
ලේකම්,
පස්ගොඩ ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 16 වැනි දින,

### තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, පස්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගා කළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.

01-956

## බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව

### 1975 අංක 4 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත

**කිතුලම්පිටිය දවුදුකන්ද මාර්ගය "සෙත්සිරි මාවත" නමින් නම් කිරීම.**

2014.12.16 (2014 දෙසැම්බර්) වැනි දින බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීමේ දී තීරණ අංක 05.01.2 දරන සහ සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 (ආ) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් ලබා දෙන ලද 2016.07.11 දිනැති අනුමැතිය ප්‍රකාර පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත සෙත්සිරි මාවත යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බඹරැන්ද ගමගේ බන්දුල,
ලේකම් හා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ
බලතල හා කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ප්‍රාදේශීය සභාව - බෝපෙ පෝද්දල.

2016 දෙසැම්බර් මස 14 වැනි දින,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | : | බෝපේ පොද්දල ප්‍රාදේශීය සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | ගාල්ල |
| 3. | ග්‍රාම සේවක කොට්ඨාසය | : | 124 C කහදූව වත්ත |
| 4. | වීථියේ වර්තමාන නම | : | කිතුලම්පිටිය දවුදුකන්ද මාර්ගය |
| 5. | අලුතින් යොදා ඇති නම | : | සෙත්සිරි මාවත |
| 6. | මාර්ගය විස්තරය | : | වරිපනම් අංක 133/1න් ආරම්භ වී වරිපනම් අංක 133/14 අවසන් වන 250 m දිගින් යුත් 4.5 m පළලින් යුත් කිතුලම්පිටිය දවුදු කන්ද මාර්ගය නමින් හැඳින්වෙන මාර්ගය. |

01-917/1

---

## බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව

### 1975 අංක 4 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත

**නාවින්න නරිදූව මාර්ගය "එක්සත් සමගි මාවත" නමින් නම් කිරීම.**

2014.09.23 (2014 සැප්තැම්බර්) වැනි දින බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභා රැස්වීමේදී තීරණ අංක 05.06.06 දරන සහ සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 (ආ) වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා විසින් ලබා දෙන ලද 2016.07.11 දිනැති අනුමැතිය ප්‍රකාර සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත එක්සත් සමගි මාවත යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බඹරැන්ද ගමගේ බන්දුල,
ලේකම් හා බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ
බලතල හා කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
ප්‍රාදේශීය සභාව - බෝපෙ පෝද්දල.

2016 දෙසැම්බර් මස 14 වැනි දින,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | | |
|---|---|---|---|
| 1. | පළාත් පාලන ආයතනයේ නම | : | බෝපේ පොද්දල ප්‍රාදේශීය සභාව |
| 2. | දිස්ත්‍රික්කය | : | ගාල්ල |
| 3. | ග්‍රාම සේවක කොට්ඨාසය | : | 127 ඊ නාවින්න, 124 ඒ තුන්හිරිපාන, 127 සී බොකරමුල්ලගොඩ |
| 4. | වීථියේ වර්තමාන නම | : | නාවින්න නරිදූව මාර්ගය |
| 5. | අලුතින් යොදු ඇති නම | : | එක්සත් සමගි මාවත |
| 6. | මාර්ගය විස්තරය | : | වරිපනම් අංක 01 න් ආරම්භ වී වරිපනම් අංක 97/7 අවසන් වන 750m දිගින් යුත් 4.5 m පළලින් යුත් නාවින්න නරිදූව මාර්ගය නමින් හැඳින්වෙන මාර්ගය |

01-917/2

---

**නිකවැරටිය ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන
(සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සේරසිංහ ආරච්චිගේ සමන් ප්‍රියන්ත වන මම,

**නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.07.11 දිනැති තීරණ අංක 657 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. එස්. ප්‍රියන්ත,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2016 ජූලි මස 11 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 02 වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ (2014.10.01 දිනැති අංක 1882/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *(අති විශේෂ) ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පලකරනු ලැබුවා වූ ද එකී *ගැසට් නිවේදනයට* සංශෝධන වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශෙෂ) *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ 2015.01.20 වැනි දින හා 1989/28 අංකයෙන් සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *(අති විශේෂ) ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ 2015.08.28 වැනි දින හා 1929/45 අංකයෙන් ප්‍රකාශයට පත් කරනු ලද්ද වූ ද නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 03 වැනි වගන්තියේ සඳහන් විධි විධානවලට අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) වැනි උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

*නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම*
*අතුරු ව්‍යවස්ථාව*

01. මෙම අතුරු ව්‍යවස්ථාව වයඹ පළාතේ නිකවැරටිය ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව නමින් හැඳින්වේ.

02. වයඹ පළාතේ නිකවැරටිය ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥාපනත යටතේ වූ විධිවිධාන ක්‍රියාත්මක වන ප්‍රදේශයක පිහිටියා වූ හෙක්ටයාර් 0.2 (පර්චස් 80) හෝ ඊට වඩා වැඩි ඉඩමක් හෝ ඉඩමකින් කොටසක් සංවර්ධනය කිරීම හෝ කට්ටි කර විකිණීම හෝ අන්සතු කිරීම හෝ සඳහා අනු බෙදුම් කරන සෑම අවස්ථාවකදීම ඊට අදාළ කටයුතු විධිමත් කිරීම, පාලනය කිරීම සඳහා විධිවිධාන සලසා දීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

03. නිකවැරටිය ප්‍රදේශීය සභාවෙහි ඉඩම් කට්ටි කිරීම හෝ සංවර්ධනය කිරීම පිළිබඳ තීරණ ගැනීම පිණිස ''නිශ්චල සහ නිවාස දේපළ සංවර්ධන කිරීමේ කමිටුව'' ක් පිහිටවිය යුතු ය. එය පහත සඳහන් අයවලුන්ගෙන් සමන් විය යුතු වේ.

I. පළාත් පාලන ආයතනයක සභාපතිවරයා (කමිටුවේ සභාපති)
II. එම පලාත් පාලන ආයතනයේ ලේකම් වරයා (කමිටුවේ ලේකම්)
III. අදාළ බල ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක (කමිටු සාමාජික)
II. පළාත් පාලන ආයතනයේ කාර්මික නිලධාරිවරයෙක් (කමිටු සාමාජික)
V. ආදායම් පරීක්ෂක හෝ ප්‍රජා සංවර්ධන නිලධාරි හෝ ආදායම් ප්‍රවර්ධන නිලධාරි හෝ පරිසර නිලධාරි යන අයගෙන් එක් අයෙකු (කමිටු සාමාජික)

03. 1. සංවර්ධන කටයුතු සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 1 වන උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුකූලව සකස් කළ අයදුම්පත්‍රයක් විය යුතු අතර එය නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙත රු. 250 ක මුදලක් ගෙවා ලබා ගත යුතු ය. අදාළ අයදුම්පත්‍රය ''පුද්ගලයෙකු හෝ ආයතනයක්'' විසින්ම අදාළ වන පරිදි මෙම අතුරු ව්‍යවස්ථාවේ 03.2 උපවගන්තියෙහි හා 03.03 උපවගන්තියෙහි සඳහන් විධිවිධාන යටතේ සඳහන් කරනු ලබන අවශ්‍යතා සම්පූර්ණ කරමින් ඉදිරිපත් කළ යුතු ය.

03. 2. නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි නිවාස හා නගර නිර්මාණ ආඥාපනත යටතේ වූ විධිවිධාන ක්‍රියාත්මක වන බල ප්‍රදේශයක පිහිටියා වූ හෙක්ටයාර් 0.2 (පර්චස් 80) සිට හෙක්ටයාර් 04 දක්වා හෙක්ටයාර් 04 ද ඇතුළත් වන පරිදි වූ ඉඩමක් හෝ ඉඩමකින් කොටසක් කැබලි හතරකට හෝ ඊට වැඩි ප්‍රමාණයකට කොටස් කරන සෑම අවස්ථාවකදීම එසේ කොටස් කිරීමටපෙර ඊට අදළ සංවර්ධන සැලැස්ම ඉහත 03 වන වගන්තියෙහි සඳහන් නිශ්චල හා නිවාස දේපළ සංවර්ධනය කිරීමේ කමිටුව වෙත පහත සඳහන් අවශ්‍යතා ද සම්පූර්ණ කරමින් ඉදිරිපත් කර අදළ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය.

(අ) හෙක්ටයාර් 02 හෝ ඊට වැඩි ප්‍රමාණයක ඉඩමක් කොටස් කරන අවස්ථාවේ දී එසේ කොටස් කිරීමෙන් පරිසර හානියක් නොමැති බවට වයඹ පළාත් සභාවේ වයඹ පළාත් පරිසර අධිකාරියෙන් ලබා ගන්නා ලද වාර්තාව.

(ආ) කට්ටි කිරීමට යෝජිත ඉඩම කුඹුරු ඉඩමක් වන විට ඒ සඳහා ගොවිජන සේවා කොමසාරිස්වරයාගේ අනුමැතිය.

(ඇ) වෙරළ කලාපයෙහි පිහිටි ඉඩමක් නම් 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත යටතේ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂකවරයාගේ අනුමැතිය.

(ඈ) කට්ටි කිරීමට යෝජිත ඉඩම සම්පූර්ණයෙන් හෝ කොටසක් හෝ කොටස් කිහිපයක් හෝ ගොඩ කිරීමට අවශ්‍ය වන්නේ නම් ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධන කිරීමේ සංස්ථාවේ නිර්දේශය.

(ඉ) කට්ටි කිරීමට යොජිත ඉඩම නළ ජල පහසුකම් නොමැති නම් පානිය ජලය ලබා ගත හැකි බවට ජල සම්පත් මණ්ඩලයේ නිර්දේශය.

(ඊ) කට්ටි කිරීමට යෝජිත ඉඩම රක්ෂිතයකට හෝ සංවේදී ප්‍රදේශයට යාබදව හෝ එහි ආරක්ෂාවට බල පවත්වන පරිදි පිහිටා ඇති විටෙක එකී රක්ෂිතය හෝ සංවේදී ප්‍රදේශය ප්‍රකාශයට පත් කරන ලද හෝ භාරව සිටින රාජ්‍ය හෝ පළාත් සභා ආයතනය මඟින් ලබා ගන්නා ලද නිර්දේශය.

(එ) සංවර්ධන සැලසුම් අයදුම්පතෙහි යෝජිත කොටස් සංඛ්‍යාව, කුඩාම කොටස් ප්‍රමාණය , විශාලම කොටස් ප්‍රමාණය, කට්ටි සැලසුමේ අභ්‍යන්තර පාරවල පළල, ජල මාර්ග, කඳුහෙල්, වලවල් හා ජල බැස්ම වෙනස් කරන විට එය සිදු කරන ආකාරය පිළිබඳ තොරතුරු ද අන්තර්ගත විය යුතු ය.

03.3 කැබලි කිරීමට යෝජිත ඉඩම හෙක්ටයාර් 02 කට වැඩි වන හා හෙක්ටයාර් 10 දක්වා හෙක්ටයාර් 10 ද ඇතුළත් වන පරිදි වූ ඉඩමක් වන විට එහි සංවර්ධන සැලැස්මට අනුමැතිය ලබා ගැනීම සඳහා අදළ පළාත් පාලන ආයතනය මගින් අදළ සංවර්ධන සැලැස්ම සහ ඉහත 03.2 උපවගන්තියෙහි (අ) සිට (එ) දක්වා සඳහන් අවශ්‍යතා සමග මෙහි 03.4 උපවගන්තිය යටතේ වන ''පළාත් මෙහෙයුම් කමිටුවේ'' ලිඛිත එකඟතාවය ලබා ගත යුත්තේ ය.

03.4 පළාත් මෙහෙයුම් කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශ ලේකම් (වයඹ පළාත) - සභාපති

වයඹ පළාත් පාලන කොමසාරිස් - කමිටුවේ ලේකම්

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් (වයඹ පළාත) - සාමාජික

වයඹ පළාත් ඉඩම් කොමසාරිස් - සාමාජික

වයඹ පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ - සාමාජික

වයඹ පළාත් නිවාස කොමසාරිස් - සාමාජික

03. 5 ඉහත 03.4 උපවගන්තියෙහි සඳහන් කමිටුවේ එකඟතාවය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම්, ව්‍යාපෘති වාර්තාව හා අදළ සියළු ලිපි ලේඛන ද සමග වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

04. ඉහත 03.2 උපවගන්තිය යටතේ සහ 03.3 උපවගන්තිය යටතේ සඳහන් පූර්ව ලිඛිත අනුමැතීන් සමග නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ඉඩමේ සංවර්ධන සැලැස්ම සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ අනුමැතිය ලබාගත යුතු ය.

05. (1) සංවර්ධන සැලැස්ම අනුමත කරවා ගැනීමකින් තොරව කිසියම් ඉඩමක් හෝ ඉඩම් කොටසක පවතින ස්ථිර භෝග වගාවකට හානි කිරීම, ඉවත් කිරීම, කපා හෝ උදුරා දැමීම නොකළ යුතුවාක් මෙන්ම එකී ඉඩම හෝ ඉඩම් කොටස කට්ටි කිරීම,කිසියම් ඉඩම් කොටසක් අන්සතු කිරීම, විකිණීම, පවරා දීම හෝ ඉඩම් කට්ටි විකිණීම සඳහා දැන්වීම් ප්‍රසිද්ධ කිරීම හෝ නොකළ යුතු ය.

06. අනුමත සංවර්ධන සැලැස්මට අනුව පිළිගත් මිනුම්දෝරුවරයෙකු ලවා පිළියෙල කරන ලද මෙහි මින් මතු අනු බෙදුම යනුවෙන් හඳුන්වනු ලබන කට්ටි සැලැස්මක් නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලවා අනුමත කරවා ගත යුතුය.

06. 1 ඉහත 06 වැනි වගන්තිය යටතේ වන අනුබෙදුම් ඉල්ලීමකට අනුමැතිය ලබාදීමට ප්‍රථම නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙත පැවරිය යුතු,

(අ) 09 (1) වන වගන්තිය හා 09 (2) උපවගන්තිවල සඳහන් පොදු ඉඩම් කොටසට අදළ හිමිකම්;

සහ

(ආ) කට්ටි කරන ලද ඉඩමෙහි ඇති කාණු පද්ධතිය, මාර්ග පද්ධතිය, සුසාන භූමි සඳහා වෙන්කල ඉඩම් හා පොදු ළිංවල හිමිකම් නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙත හිමිවන පරිදි කිසිදු ගාස්තු අයකිරීමකින් තොරව විධිමත් පරිදි නොතාරිස්වරයෙකු විසින් ලියා සහතික කර, ලියාපදිංචි කරන ලද ඔප්පු මගින් නිකවැරටිය ප්‍රාදේශීය සභාවට භාරදිය යුතු ය.

(ඇ) එසේ භාර දීමෙන් අනතුරුව අනුබෙදුම (කට්ටි සැලැස්ම) සඳහා''නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ'' අනුමැතිය ලබාගත යුතු ය.

07. නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් කට්ටි කර විකුණනු ලබන සෑම අවස්ථාවකදීම නේවාසික කාර්යයන් සඳහා වන ඉඩම් කට්ටියක අවම ප්‍රමාණය හෙක්ටයාර් 0.0375 ක් (පර්චස් 15) විය යුතු වන අතර නේවාසික නොවන කාර්යයන් සඳහා හෙක්ටයාර් 0.0152 ක් (පර්චස් 06) විය යුතු අතර නේවාසික කාර්යයන් සඳහා වෙන් කරන බිම් කැබැල්ලක අවම පළල මීටර් 12 ක් විය යුතු ය.

08. (1) කොටස් කරන ලද ඉඩම් ඇතුළත වෙන් කෙරෙන සියළුම පාරවල් මෙහි පහත සඳහන් පිරිවිතරවලට අනුකූලවිය යුතු ය.

| *ඉඩම් කැබලි සංඛ්‍යාව* | *පාරේ පළල (මීටර්)* |
|---|---|
| 04 ක් හෝ ඊට අඩුවන විට | 4 |
| 05 සිට 08 දක්වා | 5 |
| 09 සිට 20 දක්වා | 6 |
| 20 ට වැඩි වන විට | 9 |

(2) යම් අභ්‍යන්තර මාර්ගයක් වෙනත් මාර්ගයකට සම්බන්ධ නොවන්නේ නම්, එසේ සම්බන්ධ නොවන කෙළවර විෂ්කම්භය මීටර් 09 කට නොඅඩු හැරවුම් වෘත්තයක් පරිදි සකස් කළ යුතු ය.

(3) මාර්ග 02 ක් සම්බන්ධයෙන් වන මුල්ලක් කෝණාශ්‍රකාර නොවන අන්දමට මාර්ග පරිහරණය කරන්නවුන්ගේ ආරක්ෂාව සැලසෙන පරිදි මාර්ග මුලු කවාකාරව සිටින ලෙසට සැලසුම් කළ යුතු ය.

(4) මෙසේ සකස් කරනු ලබන මාර්ග නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ නිලධාරීන්ගේ උපදෙස් හා ප්‍රමිතීන්ට අනුව සංවර්ධනය කළ යුතු ය.

09. (1) කට්ටි කරනු ලබන ඉඩම හෙක්ටයාර් 01 කට (අක්කර 2.47) හෝ ඊට වැඩිවන විට ඉඩම කට්ටි කිරීමේ දී එකී කට්ටි වලින් කුඩාම කට්ටිය හෙක්ටයාර් 0.1 (පර්චස් 40) හෝ ඊට වැඩිවන්නේ නම් කට්ටි කරන ඉඩමේ මුළු ප්‍රමාණයෙන් පාරවල් සඳහා වෙන් කළ ප්‍රමාණය අතහැරිය විට ඉතිරිව බිම් ප්‍රමාණයෙන් සියයට පහක (5%) ප්‍රමාණයක් පොදු කටයුතු සඳහා වෙන් කළ යුතු ය.

(2) කට්ටි කරනු ලබන ඉඩම හෙක්ටයාර් 01 කට හෝ වැඩි නම් හා කට්ටි කරනු ලබන කැබැල්ලක ප්‍රමාණය හෙක්ටයාර් 0.1 (පර්චස් 40) වඩා අඩු නම් එම අවස්ථාවේ දී එම ඉඩමේ මුලු ප්‍රමාණයෙන් පාරවල් සඳහා වෙන් වූ ප්‍රමාණය අතහැර ඉතිරි වන බිම් ප්‍රමාණයෙන් සියයට දහයක් (10%) ප්‍රමාණයෙන් පොදු කටයුතු, පොදු ළිං හා සුසාන භූමි සියලුම පාරවල් සඳහා අවශ්‍ය වන විට වෙන් කළ යුතු ය. මෙසේ නිකවැරටිය ප්‍රාදේශීය සභාව සඳහා වෙන් කරනු ලබන ඉඩම් කොටස් ප්‍රයෝජනයට ගත හැකි ඉඩම් කොටස් විය යුතු අතර ගල්කුළු, මඩවගුරු, සහිත ඉඩම් කොටස් නොවිය යුතු ය.

(අ) කට්ටි කිරීමට සකසන බිම් කට්ටි ප්‍රමාණය පදනම් කරගෙන එකී ඉඩම් කට්ටි සඳහා නළ ජල පහසුකම් නොසලසන්නේ නම් ඉඩම් කට්ටි 40 කට හෝ ඊට අඩු කොටසකට එක් පොදු ළිඳක් බැගින් ඉදිකරවා එකී ළිඳ පිහිටි භූමිය ද සමඟ නිකවැරටිය ප්‍රාදේශීය සභාවට භාර දිය යුතු ය.

(3) කට්ටි කර විකුණන ඉඩම් කැබලි ප්‍රමාණය කැබලි 40කට වැඩිනම් සෑම ඉඩම් කට්ටියකටම නළ ජල පහසුකම් සැලසීම අනිවාර්ය වන අතර ඉඩම් කැබලි විකිණීම හෝ අන්සතු කිරීමට පෙර නළ ජල මාර්ග පද්ධතිය සකසා ජල ප්‍රභවය ඉදිකර තිබිය යුතු ය.

(4) කට්ටි කරනු ලබන ඉඩම හරහා ඇති ස්වභාවික ජල මාර්ගයක් වේ නම්, හෝ වැව් පොකුණු වේ නම්, එකී ජල මාර්ගයට පොකුණට රක්ෂිතයක් වෙන් කර දක්වා එය අනු බෙදුමට ඇතුළත් කර පෙන්විය යුතු ය.

(5) කට්ටි කරනු ලබන ඉඩමේ ඇති සෑම ඉඩම් කැබැල්ලකටම තෙකලා විදුලිබල පහසුකම් ලබා ගැනීමට හැකිවන පරිදි කට්ටි කරනු ලබන ඉඩමේ ඇති සෑම මාර්ගයකටම තෙකලා විදුලිබල පහසුකම් සපයා තිබිය යුතු ය.

(6) (අ) මෙම අතුරු ව්‍යවස්ථාව බල පැවැත්වෙන දිනයෙන් පසුව හෙක්ටයාර් එකකට වැඩි විශාලත්වයකින් යුත් ඉඩමක් හෙක්ටයාර් එකකට අඩු කොටස් දෙකකට හෝ ඊට වැඩි කොටස් ගණනකට වෙන් කිරීම වසර 10 ක් ඉක්මවා යාමට පෙර එකී කොටස් වෙන් වෙන් වශයෙන් එක් අවස්ථාවකදී හෝ අවස්ථා කිහිපයක දී හෝ කට්ටි කඩා විකිණීම හෝ අන්සතු කිරීම හෝ පවරා දීම හෝ කරයි නම් මෙම වගන්තියේ (1), (2) හා (3) උපවගන්තිවල අවශ්‍යතාවය යන මෙම අතුරු ව්‍යවස්ථා බල පැවැත්වෙන දිනට මුලු ඉඩමේ පැවැති විශාලත්වය මත ගණනය කරනු ලබන්නේය.

(ආ) ඉහත ඡේදයේ දස වසරක කාලය ගණන් ගනු ලබන්නේ ඉඩම කොටස් දෙකකට හෝ ඊට වැඩි ගණනකට බෙද වෙන්කර ඒ සඳහා ඔප්පු ලියාපදිංචි කරන ලද දින පටන්වේ.

10. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත 09 යටතේ කුමක් සඳහන් වුව ද නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ උරුමයන් හෝ යම් දේපළක අයිතිවාසිකම් යටතේ උරුමයෙන් වන හෝ තෑගි දීමනාවක් වශයෙන් වන පැවරුමක දී හෝ දිසා අධිකරණයක අයිතිවාසිකම් පිළිබඳ වන නඩු තීන්දු ප්‍රකාශයක විධිවිධාන යටතේ ඉඩම් කොටස් නිශ්චය කිරීම සඳහා වන අනු බෙදුමක දී ඉහත 9 වගන්තියේ විධිවිධාන අයත් නොවන්නේ ය.

11. අනුමත සංවර්ධන සැලැස්මේ වලංගු කාලය මාස 06 ක් වන අතර, මෙම කාල සීමාව තුළ අනු බෙදුම ඉදිරිපත් කර අනුමත කරවා ගැනීමට අයදුම්කරුවෙකු අපොහොසත් වේ නම් ඔහුගේ ලිඛිත ඉල්ලීමක් මත ඉදිරියට මාස 03 බැගින් වූ කාල පරිච්ඡේද දෙකකට වලංගු කාලය දීර්ඝ කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය.

12. අනුබෙදුමක් අනුමත වීමෙන් පසුව එහි වලංගු කාලය වසර 01 ක් වන අතර, එම කාලසීමාව තුළ සියලු ඉඩම් කට්ටි විකුණා අවසන් නොකළේ නම්, අයදුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයාට ඉදිරියට වලංගු කාල දීර්ඝ කළ හැකි ය.

13.1 මෙම අතුරු ව්‍යවස්ථාවේ 03.2 උපවගන්තිය හා 03.3 උපවගන්තිය යටතේ වන පූර්ව ලිඛිත අනුමැතිය සහ අදළ වාර්තා සමග සංවර්ධන සැලැස්ම නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ලැබී මාසයක් ඇතුළත එකී සංවර්ධන සැලැස්ම නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් අනුමත කිරීම හෝ නොකිරීම කළ යුතු ය. එසේම මෙහි 06 වැනි වගන්තියේ සඳහන් අනුබෙදුම (කට්ටි සැලැස්ම) නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ලැබී සති 04 ක් ඇතුළත ඒ සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් අනුමැතිය ලබා දීම හෝ නොදීම කළ යුතු ය.

13.2 ඉහත 13.1 වන වගන්තියෙහි සඳහන් අනුමැතීන් ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එසේ අනුමැතිය ලබා දීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු අයදුම්කරු වෙත ඉහත 13.1 වන වගන්තියේ සඳහන් කාල සීමාවන් තුළ ලිඛිතව දන්වා යැවිය යුතු ය.

13.3 ඉහත (1) හා (2) උපවගන්ති අනුව කටයුතු කිරීමට නිකවැරටිය ප්‍රාදේශීය සභාව අපොහොසත් වන්නේ නම්, අයදුම්කරුට වයඹ පළාත් පාලන කොමසාරිස්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ ය.

14.1 වයඹ පළාතේ පරිපාලන බල සීමාව තුළ නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම කරනු ලබන "පුද්ගලයකු හෝ ආයතනයක්" විසින් ඒ සඳහා වයඹ පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ලියාපදිංචි විය යුතු ය. ලියාපදිංචිය සඳහා පහත සඳහන් ගාස්තු ගෙවිය යුතු ය.

| | | |
|---|---|---|
| මුල් ලියාපදිංචිය සඳහා | - | රු. 500,000.00 |
| වාර්ෂිකව ලියාපදිංචිය අලුත් කිරීම සඳහා | - | රු. 100,000.00 |

(2) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වන වගන්තිය ප්‍රකාරව අදළ වන පමණට අදළ කර ගැනීම සඳහා සෑම ඉඩම් අයිතිකරුවෙක්, වෙන්දේසිකරුවෙක්, බ්‍රෝකර්වරයෙක්, හෝ අනුයුක්තිකයෙක් ස්වකීය ඉඩම් විකිණීම ආරම්භ කළ දින සිට අනු බෙදුම් සැලැස්මට ඇතුළත් වූ සියලු ඉඩම් කොටස් විකිණීම අවසන් වන තෙක් කාල සීමාව තුළ ඉඩම් විකිණීම සම්බන්ධයෙන් හා ඊට අදළ ප්‍රතිඡ්ඨාවන් පිළිබඳ වාර්තාවක් ත්‍රෛමාසිකව නිකවැරටිය ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු ය. මෙහි II උපලේඛනයේ ආකෘතියට අනුරූපව අයදුම්කරු විසින් නිකවැරටිය ප්‍රාදේශීය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

15. සංවර්ධන සැලැස්ම හෝ අනුබෙදුම අනුමත කරවා ගැනීම සඳහා පරීක්ෂණ ගාස්තු වශයෙන් අයදුම්කරු විසින් නිකවැරටිය ප්‍රාදේශීය සභාවට පහත සඳහන් පරිදි වූ ගාස්තුවක් ගෙවිය යුතු ය.

| *ප්‍රමාණය* | *සංවර්ධන සැලැස්ම* | *අනුබෙදුම* |
|---|---|---|
| | *රු. ශත* | *රු.ශත* |
| හෙක්ටයාර් එකට අඩු | 500.00 | 500.00 |
| හෙක්ටයාර් එකට වැඩි 2 දක්වා | 700.00 | 700.00 |
| හෙක්ටයාර් 2ට වැඩි 4 දක්වා | 1,000.00 | 1,000.00 |
| හෙක්ටයාර් 4 ට වැඩි | 1,250.00 | 1,250.00 |

16.1 ඉහත 14.1 වන වගන්ති යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලබා ගන්නා "පුද්ගලයෙකු හෝ ආයතනයක්" එම සහතිකය උපයෝගී කරගෙන මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කාර්යයන් සඳහා භාවිතා කිරීමට වෙනත් කිසිදු පාර්ශවයක් වෙත අවස්ථාව ලබා දීම නීත්‍යානුකූල නොවන්නේ ය.

16.2 යම් හෙයකින් මෙම අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් වගන්තිවලින් විස්තර කෙරෙන අවශ්‍යතාවලින් කිසියම් අවශ්‍යතාවයක් නොසපුරාලමින් ද මෙම අතුරු ව්‍යවස්ථාවේ විස්තර වන පටිපාටියෙන් හා සාමාන්‍ය කාර්යාල පටිපාටිවලින් බැහැරව ලබා ගන්නා හෝ නිකුත් කෙරෙන යම් බලපත්‍රය බල රහිත හා ශූන්‍ය වන්නේ ය.

16.3 මෙම අතුරු ව්‍යවස්ථාව "පුද්ගලයෙකු හෝ ආයතනයක්" විසින් උල්ලංඝණය කිරීමක් සිදු කරන විටෙක දී හෝ කර ඇතිවිටෙක දී ඒ බැව් නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් හෝ වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් සිදු කරනු ලබන පරීක්ෂණයක දී තහවුරු වුවහොත්

අදළ ඉඩම හෝ ඉඩමකින් කොටසක් සංවර්ධනය කිරීම හෝ කට්ටි කර විකිණීම හෝ අන්සතු කිරීම හෝ සඳහා අනු බෙදුම් කිරීමේ ක්‍රියාවලිය වහාම ක්‍රියාත්මක වන පරිදි අදළ නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් තහනම් කිරීම හා නතර කිරීම නීත්‍යානුකුල වන්නේ ය. එසේ තහනම් කරනු ලබන සෑම අවස්ථාවකදීම තහනම් කළ බලධාරියා විසින් අදළ ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත දන්වා ඊට සම්බන්ධ ඔප්පු හා වෙනත් ලේඛන ලියාපදිංචිය අත්හිටුවීම සිදු කිරීමට කටයුතු කර අදළ "පුද්ගලයෙකු හෝ ආයතනයක්" වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් නඩත්තු කරනු ලැබිය යුතු අසාධු ලේඛනයට ඇතුළත් කළ යුත්තේ ය.

17. මෙම අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා -

"ප්‍රාදේශීය සභා සභාපතිවරයා" යන්නෙන් ප්‍රස්තුත ඉඩම පිහිටි නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අයත් වන නිකවැරටිය ප්‍රාදේශීය සභාවෙහි සභාපතිවරයා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා" යන්නෙන් ප්‍රස්තුත ඉඩම පිහිටි නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අයත් වන නිකවැරටිය ප්‍රාදේශීය සභාවෙහි ලේකම්වරයා අදහස් වන්නේය.

"ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය" යන්නෙන් ප්‍රස්තුත ඉඩම පිහිටි නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අදහස් වන්නේය.

"කුඹුරු ඉඩම" යන්නෙන් 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම සැලකේ.

"සංවර්ධනය" යන්නෙන් නගර හා ග්‍රාම නිර්මාණ ආඥපනතේ (269 අධිකාරිය) ඒ සඳහා දී ඇති අර්ථයම සැලකේ.

"පොල් ඉඩම" යන්නෙන් ප්‍රධාන භෝගය ලෙස පොල් වගාකොට තිබූ හෝ දැනට පොල් වගාකර ඇති ඉඩමක් අදහස් වන්නේය.

"පිළිගත් මින්න්දෝරු" යන්නෙන් මිනින්දෝරුවරයෙකු වශයෙන් සේවය කිරීමට මිනින්දෝරු ආඥපනතේ විධිවිධාන යටතේ බලය ලැබූ අයෙක් අදහස් වන්නේය.

"නේවාසික" යන්නෙන් පදිංචිය සඳහා යොද ගන්නා නිද ගැනීමේ, ආහාර පිසීමේ හා සනීපාරක්ෂක පහසුකම් ස්වාධීනව ඇති පදිංචිය සඳහා වූ අංග සම්පූර්ණ ඒකකයකින් සමන්විත කාමරයක් හෝ කාමර පන්තියක් හෝ අඩංගු ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි සමූහයක් අදහස් වන්නේ ය.

"නේවාසික නොවන" යන්නෙන් නේවාසික නොවන්නාවූ ඕනෑම කාර්යයක් අදහස් වන්නේය.

"අනුබෙදුම" යන්නෙන් ඉඩමක කට්ටි කිරීමේ සැලැස්ම අදහස් වන්නේය.

"සංවේදී ප්‍රදේශය" යන්නෙන් 1990 අංක 12 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තියෙහි ඒ සඳහා දී ඇති අර්ථයම සැලකේ.

"රක්ෂිතය" යන්නෙන් ඉඩම් සංවර්ධන ආඥ පනතේ අර්ථ ගැන්වීම අදළ වේ.

"පුද්ගලයෙකු හෝ ආයතනයක්" යන්නට ඉඩම් කට්ටි කර විකිණීමේ පරමාර්ථයෙන් කටයුතු කරන යම් පුද්ගලයෙකු, යම් ආයතනයක්, යම් වෙන්දේසිකරුවෙකු, යම් බ්‍රෝකර්වරයෙකු හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයෙකු, යම් ව්‍යාපාරිකයෙකු, ව්‍යාපාරික සමාගමක්, යම් අනුබෙදුම්කරුවෙකු, යම් සංවර්ධනකරුවෙකු අදහස් වේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හට ගන්නේ නම් සිංහල පාඨය බලපැවැත්විය යුතු ය.

**1 උපලේඛනය**

*වයඹ පළාතේ ඉඩම් කට්ටි කර විකිණීම සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම :——————————————.
02. අයදුම්කරුගේ ලිපිනය:——————————————.
03. අයදුම්කරුගේ හැඳුනුම්පත් අංකය:——————————————.
04. අයදුම්කරුගේ දුරකථන අංකය:——————————————.
05. ආයතනයේ නම:——————————————.

06. ආයතනයේ ලිපිනය :————————————————.
07. ආයතනය පිහිටි දිස්ත්‍රික්කය:————————————————.
08. අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:————————————————.
09. ග්‍රාම නිලධාරී කොට්ඨාසය:————————————————.
10. අදාළ ඉඩමේ ඔප්පුවේ හා සැලැස්මේ අංකය:————————————————.
11. අදාළ ඉඩමේ කට්ටි කිරීමට යෝජිත කැබලි ප්‍රමාණය:————————————————.
12. i. ව්‍යාපාරයක් හෝ ආයතනයක් වශයෙන් රජයේ ලියාපදිංචිය ලබා තිබේ ද ? (ඔව් නම් එම සහතිකය සහ ඡායා පිටපතක් ඉදිරිපත් කරන්න):————————————————.
ii. ඉඩම් කට්ටි කිරීම් ආයතනයක් ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහතිකය ලබා තිබේ ද?

13. ඉඩම් කට්ටි කර විකිණීම සම්බන්ධයෙන් මීට පෙර ලබා ඇති පළපුරුදුකම් පිළිබඳ විස්තර සඳහන් කරන්න.

| *වර්ෂය* | *ඉඩමේ නම* | *ප්‍රමාණය* | *අදළ ප්‍රා. ස.* | *ප්‍රා. ස. අනුමැතිය ලබා තිබේද?* |
|---|---|---|---|---|
| .......................... | ....................... | .......................... | .............................. | .............................. |
| .......................... | ....................... | .......................... | .............................. | .............................. |

මා විසින් ඉහතින් දක්වා ඇති විස්තර නිවැරදි බවත් යම් හෙයකින් අදළ තොරතුරු අසත්‍ය බව හෙලිවුවහොත් ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීමට යටත් වන අතර මෙම බලපත්‍රය අවලංගු වීමට යටත් වන බවත් දනිමි. ඒ අනුව ............ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කර විකිණීම සඳහා බල පත්‍රයක් නිකුත් කරන මෙන් ඉල්ලා සිටිමි.

.........................
අත්සන.

දිනය ..........................

## II උපලේඛනය

***නිවාස දේපළ සංවර්ධනය හා ඉඩම් කට්ටි කර විකිණීම පිළිබඳ වාර්තාව***

සභාපති,

..................ප්‍රාදේශීය සභාව

01. ඉඩමේ නම :————————————————.
02. සංවර්ධන සැලැස්ම අනුමත කළ දිනය හා අංකය :————————————————.
03. අනු බෙදුම අනුමත කළ දිනය හා අංකය :————————————————.
04. අනු බෙදුමට අදළ ඉඩම් කට්ටි සංඛ්‍යාව :————————————————.
05. විකිණී ඇති ඉඩම් කට්ටි පිළිබඳ විස්තරය :————————————————.
5.1 20 ...............මස..............දින සිට
20 ...............මස..............දින දක්වා

5.2 නොතාරිස්වරයාගේ නම සහ ලිපිනය
5.3

| අනුබෙදුම අනුව කට්ටි අංකය | මිලදී ගත් අයගේ නම හා ලිපිනය | ඔප්පු අංකය හා දිනය | වටිනාකම |
|---|---|---|---|
| | | | |

දිනයඃ..........................

අත්සනඃ..........................
නමඃ..........................

01-784/1

**නිකවැරටිය ප්‍රාදේශීය සභාව**

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සේරසිංහ ආරච්චිගේ සමන් ප්‍රියන්ත වන මම, ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරිම, ගාස්තු අය කිරීම පිළිබඳ අතුරුව්‍යවස්ථාව

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.08.29 දිනැති තීරණ අංක 744 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. එස්. ප්‍රියන්ත,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 29 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 02 වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.08.31 දිනැති අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශෙෂ) *ගැසට් පත්‍රයේ* iv (අ) කොටසේ පළකරනු ලැබුවා වූ ආදාහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 03 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) වැනි උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මම තීරණය කරමි.

**ආදාහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් කුමක් ප්‍රකාශ වුව ද 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ ඇති විධිවිධාන හා අනනුකූල නොවිය යුතු ය.

3. *(අ)* සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව ප්‍රාදේශීය සභාවට අයත් කිසියම් ආදහනාගාරයක කවර හෝ මෘත ශරීරයක් ආදහනය නොකළ යුතු ය.

*(ආ)* මියගිය යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ මහෙස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබ, එකී පරීක්ෂණය අවසානයේ මෘත දේහය ආදහනය කිරීමට එකී මහෙස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා අවසරයක් දී ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදහනය කිරීමට භාර ගැනීම හෝ ආදහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

*(ඇ)* මියගිය යම් තැනැත්තකුගේ මරණ සහතිකයේ 7 වන තීරුවේ "මරණයට හේතුව හා භූමදාන හෝ ආදහනය කළ ස්ථානය" යන්නෙහි, නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ අදළ ආදහනාගාරය නම් කර සඳහන්ව ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදහනය කිරීමට භාර ගැනීම හෝ ආදහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

*(ඇ)* සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් වාර්ෂිකව තම බල ප්‍රදේශයේ පවතින ආදහනාගාර පිහිටි ස්ථානය හා ලිපිනය දැක්වෙන ලේඛනයක් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. *(අ)* මෘත ශරීරයක් ආදහනය කිරීමට අයකරන ගාස්තු ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරනුලැබිය හැකි අතර එවැනිම යෝජනා සම්මතයක් මගින් එකී ගාස්තු කළින් කල සංශෝධනය කිරීම නීත්‍යානුකූල වන්නේය.

*(ආ)* ඉහත (අ) ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කල සංශෝධනය කරන ගාස්තු ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර ආදහනාගාරය වෙන්කරවා ගැනීමට අයදුම්පත් භාරගන්නා ස්ථානයේ සහ ආදහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම ද කළ යුතු ය.

*(ඇ)* මෘත ශරීරයක් ආදහනය කිරීමට අයකරන ගාස්තු මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන වර්ගීකරණය යටතේ පනවනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

5. 3 වන වගන්තියේ දැක්වෙන අවසර පත්‍රයක් ලබා ගැනීම අපේක්ෂා කරන (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තෙකු මෙහි පහත දැක්වෙන ලේඛන සමග මෙහි දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ නිකවැරටිය ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් ඉල්ලුම් පත්‍රයක් සභාපතිවරයා හෝ ආදහනාගාර භාරකරු නොවන බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* ඉල්ලුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කිරීමට අදළ කරගත හැකිවනු පිණිස -

(i) ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත, ; හෝ
(ii) ඉල්ලුම්කරුගේ රියැදුරු බලපත්‍රය ; හෝ
(iii) ඉල්ලුම්කරුගේ විදේශ ගමන් බලපත්‍රය යන ඒවායින් එකක් ඉදිරිපත් කිරීම මගින්

*(ආ)* මියගිය තැනැත්තාගේ මරණ සහතිකය හෝ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41.1 (ආ) වගන්තිය යටතේ නිකුත් කරන ලද මරණ දැන්වීම හෝ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන B - 24 ආකෘතිය.

*(ඇ)* මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, එකී පරීක්ෂණය පවත්වන ලද මහෙස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41(ඉ) ඡේදය යටතේ මෘත ශරීරය ආදහනය කිරීමට අවසර දෙමින් නිකුත් කළ සහතිකය හෝ අජීවී උපතකින් බිහිකළ මෘත ශරීරයක් නම් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 43(ආ) ඡේදය යටතේ නිකුත් කළ සහතිකය.

6. මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත්‍රයක් මත අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද්දේ නම් එවැනි අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව මෙහි තුන්වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ලේඛනයක ලේඛනගත කිරීම සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. මේ ලේඛනය අයදුම්පත් භාරගන්නා ප්‍රාදේශීය සභාවේ කාර්යාලයයේ පවත්වාගත යුතු ය.

7. *(අ)* ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයකට අනුව 3 වන වගන්තියේ විධිවිධානයන්ට පටහැනි නොවන අයුරින් යම් මෘත ශරීරයක් ආදහනය කිරීම සඳහා තීරණය කරන ලද්දේ නම්, 4 වන වගන්තියට අනුව පනවන ලද නියමිත ගාස්තුව අයකර ගැනීමෙන් පසුව, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා වන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එකී අවසර පත්‍රයට අනුව ආදහනය කිරීමට නියමිත මෘත ශරීරය ආදහනාගාර භාරකරු වෙත ගෙනැවිත් භාරදිය යුතු දිනය හා වේලාව එකී අවසර පත්‍රයෙහි පැහැදිලිව සටහන් කර තිබිය යුතු ය.

*(ආ)* 3 වන වගන්තියේ සඳහන් කරුණු සම්පූර්ණ නොවීම මත ආදහනය කිරීම සඳහා මෘත ශරීරයක් භාර නොගන්නේ නම්, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඊට හේතු වූ කරුණු ද සමග ඒ බව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් වන අවස්ථාවේ දී ම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

8. *(අ)* ආදහනය කිරීම සඳහා සතියේ සෑම දිනකම පෙරවරු 7.00 සිට පස්වරු 7.00 දක්වා කාලය ඇතුළත මෘත ශරීර භාර ගැනීම කළ හැකිය. මෘත දේහ ආදහනය කරනු ලබන වේලාවන් ප්‍රාදේශීය සභාව විසින් කළින් කළ තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

*(ආ)* ආදහනාගාර පරිශ්‍රයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ආදහන කටයුතු සිදු කරනු ලබන කාලසටහන දෛනිකව ප්‍රදර්ශනය කළ යුතු ය.

9. නිකුත් කළ අවසර පත්‍රයේ නිරූපිත වේලාවට හෝ ඊට පෙර මෘත දේහය ආදහනාගාර භාරකරුට භාරදිය යුතු ය. එකී වේලාවට මෘත දේහය භාර දීමට ප්‍රමාද වීම හේතුවෙන් ඉල්ලුම්කරුට හෝ මියගිය තැනැත්තාගේ අයිතිවාසිකම් ඇති වෙනත් යම් තැනැත්තකුට සිදුවන යම් අපහසුතාවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වගකීමට යටත් නොවිය යුතු ය.

10. සෑම ආදහනාගාරයකම ආදහනය කරන ලද එක් එක් මෘත දේහය සම්බන්ධයෙන් සිව්වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ලේඛනයක් ආදහනාගාර භාරකරු විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

11. *(අ)* කිසියම් මෘත දේහයක් ආදහනය කිරීමෙන් පසු එකී මෘත දේහයේ භෂ්මාවශේෂ ලබා ගැනීමට ඉල්ලුම්කරු අදහස් කරන්නේ නම් ඒ බව දෙවන උපලේඛනයේ සඳහන් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතු අතර මෘත දේහය ආදහනය කිරීම සඳහා බාරදෙනු ලබන අවස්ථාවේ දී භෂ්මාවශේෂ බහාලීම පිණිස ඒ සඳහා ප්‍රමාණවත් භාජනයක් ආදහනාගාර භාරකරු වෙත සැපයීම ඉල්ලුම්කරුගේ කාර්යය විය යුතු ය. සෑම මෘත දේහයක්ම ආදහනය කර පැය හැත්තෑ දෙකක් ගතවීමට මත්තෙන් ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් එකී මෘත දේහයේ භෂ්මාවශේෂ භාරගත යුතු ය.

*(ආ)* එසේ වුව ද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී භෂ්මාවශේෂ ආදහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කිරීම කරනු ලැබිය හැකිය. මෙසේ දීර්ඝ කරනු ලැබිය හැකි සම්පූර්ණ කාලය දින හතක් නොඉක්මවිය යුතු ය.

*(ඇ)* එසේ භෂ්මාවශේෂ ඉවත්කර ගැනීමට ඉඩදෙන ලද කාලය අවසන් වීමෙන් පසුව ද ඉවත්කර නොගත් භෂ්මාවශේෂ බැහැර කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට හෝ ආදහනාගාර භාරකරු විසින් ආදහනාගාරයේ පවතින වලකට බහාලීම නීත්‍යානුකූල වන්නේ ය.

*(ඈ)* කිසියම් ඉල්ලුම්කරුවෙකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් භාර නොගත් භෂ්මාවශේෂ, ආදහනාගාර පරිශ්‍රයේ හෝ යම් සුසාන භූමියක වල දැමීමට කටයුතු සැලැස්වීම ආදහනාගාර භාරකරුගේ කාර්යය වන්නේය.

*(ඉ)* කිසිදු මෘත දේහයක භෂ්මාවශේෂ අයදුම්පත්‍රයේ සඳහන් ඉල්ලුම්කරුට හැර වෙනත් අයකුට ලබාදීම නොකළ යුතු ය.

12. *(අ)* කිසියම් අදහනාගාරයක, අදහන කුටීරයට මෘත දේහය ඇතුළත් කර එහි ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටීරය ආවරණය කළ කොටසට ආදහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින් හැර වෙනත් යම් තැනැත්තකු ඇතුළුවීම නොකළ යුතු ය.

(ආ) සභාපතිවරයාගේ, බලයලත් නිලධාරියාගේ හෝ ආදහනාගාර භාරකරුගේ අවසරය නොමැතිව යම් ආදහනාගාර පරිශ්‍රයකට ඇතුල්වීම නොකළ යුතු ය.

*(ඇ)* (ආ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද -

(i) මෘත දේහයක් ආදහනය කිරීමට යම් තැනැත්තෙකු අවසර පත්‍රයක් ලබා ඇත්තේ නම්, මෘත දේහය ආදහනය සඳහා භාරදීමට ඔහු හෝ ඔහුගේ බලයලත් තැනැත්තෙකු සමග එකී අවස්ථාවට සහභාගීවන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන්; සහ

(ii) ආදහනය කරන ලද යම් මෘත දේහයක භෂ්මාවශේෂ භාර ගැනීමට නියමිත දින හෝ එදිනට පෙර අවසරය පත්‍රය ලබා ඇති තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමග පැමිණෙන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් ආදහනාගාර පරිශ්‍රයට ඇතුල්වීමට අවසරය ලැබී ඇති තැනැත්තන් ලෙස සළකනු ලැබිය යුතු ය.

13. යම් ආදහනාගාර පරිශ්‍රයක් තුළ -

*(අ)* සාමය කඩවන ආකාරයෙන් හැසිරීම,
*(ආ)* ආදහනාගාර පරිශ්‍රය තුළ ඇති ප්‍රාදේශීය සභාවට අයත් දේපළවලට අලාභහානි කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම,
*(ඇ)* ආදහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ යම් සහායකයකුගේ රාජකාරියට බාධා කිරීම,
*(ඈ)* ආදහනාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීම් ඇලවීම

නොකළ යුතු ය.

14. (අ) මෘත ශරීර ආදහනය කිරීමට සුදුසු තත්ත්වයකින් (ආදහනාගාරයක උෂ්ණත්වය) ආදහනාගාර නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ආ) යම් ආදහනාගාරයක් ප්‍රතිසංස්කරණය කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා එකී ආදහනාගාරය වසා තබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනයක් භාෂාත්‍රයෙන්ම මෘත දේහ ආදහනය සඳහා අවසරපත් නිකුත් කරන කාර්යාලයේ සහ ආදහනාගාර පරිශ්‍රයට ඇතුල්වන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ඇ) කිසියම් ආදහනාගාරයක ආදහනය කිරීම සඳහා භාරගනු ලැබූ මෘත දේහයක් පූර්ණ වශයෙන් ආදහනය කිරීමට නොහැකි වන ආකාරයෙන් ආදහනාගාරය අක්‍රීය වන අවස්ථාවක දී එකී මෘත දේහය ද්‍රව භාවිතයෙන් ආදහනය කිරීම හෝ අවස්ථානුකූලව මෘත ශරීරයේ ඉතිරි වූ කොටස් සුසානභූමියේ භූමදානය කිරීම සඳහා සභාපතිවරයා විසින් ගනු ලබන තීරණ නීත්‍යානුකූල වන්නේ ය. ඒ සඳහා එකී ආදහනාගාර පරිශ්‍රය තුළ ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ඇති කර තිබීම ප්‍රදේශීය සභාවේ කාර්යයන් විය යුතුය.

(ඈ) සුදුසුකම්ලත් අයෙකුගෙන් මෘත ශරීර දහනයට වැයවන ගෑස් ප්‍රමාණය පිළිබඳ ප්‍රමාණ ඇතුළත් දැන්වීමක් ප්‍රදර්ශනය කළ යුතුය.

(ඉ) දහනය වන ගෑස් නිරීක්ෂණය කිරීමට මීටර් සවිකර තිබිය යුතු ය.

(ඊ) ආදහනාගාරයේ ප්‍රමිතිය පිළිබඳ සුදුසුකම් ලත් අයෙකුගෙන් වාර්තාවක් කලින් කළ ලබාගැනීම නීත්‍යානුකූල වන්නේය.

15. නව ආදහනාගාරයක් ඉදිකිරීමට පෙර පළාත් පරිසර අධිකාරියෙන් නිකුත් කරනු ලබන නිරවුල් සහතිකය හා ආදහනාගාරය පවත්වාගෙන යාම සඳහා වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමත් දැනට ආරම්භකර ඇති ආදාහනාගාර සඳහා ප්‍රාදේශීය සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීමෙන් අනතුරුව එළඹෙන වර්ෂයේ සිට වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමත් කළ යුතු ය.

16. මේ අතුරු ව්‍යවස්ථාව කවර වූ හෝ වගන්තියක දැක්වෙන නියමයන් හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංගණය කිරීම වරදක් විය යුතුය. එකී කිසියම් වරදක් සම්බන්ධව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය මහෙස්ත්‍රාත් අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ අතුරු ව්‍යවස්ථාවේ -

"ආදහන කුටීරය" යන්නෙන්, ආදහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරයට පිටතින් සාදන ලද බාහිර කුටීරය ද,

"ආදහනාගාරය" යනුවෙන්, ද්‍රව පීඩිත (LP) වායු හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන එක්වරක දී එක් මෘත ශරීරයක් පූර්ණ දහනයට ලක්වන කුටීර දෙකකින් සමන්විත පිරියතය ද,

"ආදහනාගාරයක උෂ්ණත්වය" යන්නෙන්, දහන කුටීරය තුළ අවම උෂ්ණත්වය සෙල්සියස් අංශක 800ක් පවත්වාගෙන යා හැකි සහ මෘත ශරීරය දහනය වන අවස්ථාවේ දී සෙල්සියස් අංශක 1000 දක්වා තිබිය යුතු උෂ්ණත්වය ද,

"ආදහනාගාර පරිශ්‍රය "යන්නෙන්, සම්පූර්ණ ආදහනාගාරය සහ ඊට අයත් භූමිය ද,

"ආදහනාගාර භාරකරු" යන්නෙන්, තත් කාලයේ දී ප්‍රාදේශීය සභාවේ ආදහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත්කරනු ලැබ ඇති යම් සේවකයකු ද,

"ඉල්ලුම්කරු" යන්නෙන්, කිසියම් මෘත දේහයක් ආදහනය කිරීම පිණිස සභාපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන කවර හෝ තැනැත්තෙකු ද,

"බලයලත් නිලධාරියා " යන්නෙන්, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු ද,

"භෂ්මාවශේෂ" යන්නෙන්, යම් මෘත දේහයක් ආදහනය කිරීමෙන් අනතුරුව, මෘත දේහයේ සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂ වන යම් ද්‍රව්‍යයන් ද,

"මෘත ශරීරය" යන්නෙන්, මියගිය කිසියම් තැනැත්තෙකුගේ මෘත දේහය හෝ අජීවී දරු උපතක මෘත දේහය ද,
"සභාපතිවරයා" යන්නෙන් නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාද,
"සභාව" යන්නේන් නිකවැරටිය ප්‍රාදේශීය සභාව ද අදහස් විය යුතු ය.

***පළමුවන උපලේඛනය***

*4 වැනි වගන්තිය*

**ආදාහනාගාරය පාවිච්චි කිරීමේ දී අයකරන ගාස්තු පිළිබඳ උපලේඛනය**

| *ගාස්තු බාණ්ඩ අංකය* | *ගාස්තු අය කිරීමේ වර්ගීකරණය* | *වටිනාකම රු. ශත* |
|---|---|---|
| 1. | බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 2. | බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 3. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 4. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 5. | බල ප්‍රදේශය තුළ පදිංචි ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශිත අඩු ආදායම් ලාභියෙකුගේ පවුලේ වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 6. | බල ප්‍රදේශය තුළ පදිංචි ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශිත අඩු ආදායම් ලාභියෙකුගේ පවුලේ වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |

මෙහි වැඩිහිටි අයෙකු නොවන අයෙකු යන්නෙන්, වයස අවුරුදු 12ට අඩු ළමයෙකු අදහස් වේ.

දෙවන උපලේඛනය

(පසුපිට)

........................................මහත්මා/මහත්මිය/මෙනවිය

..........................................

මහත්මයාණෙනි/මහත්මියෙනි/මෙනවියෙනි,

*මෘත දේහයක් ආදහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම*

ඔබ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති පසු පිටේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුව, අවසර පත්‍රයක් නිකුත් කිරීම පහත දැක්වෙන හේතුමත ප්‍රතික්ෂේප කරන බව කණගාටුවෙන් දන්වනු කැමැත්තෙමි.

(i) ..........................................
(ii) ..........................................
(iii) ..........................................
(iv) ..........................................
(v) ..........................................

..........................................
සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය : 20 .........................

---

ආදහනාගාර භාරකරු,
......................... ආදහනාගාරය.

**මෘත දේහයක් ආදහනය කිරීමට නිකුත් කරන අවසර පත්‍රය**

*(අ)* ................................................. යන අයගේ මෘත දේහය 20 .................ක්වූ .........................මස ...................දින, පෙරවරු/පස්වරු .........................ට ......................... ආදහනාගාරයේ දී ආදහනය කිරීමට මෙයින් අවසර දෙමි.

*(ආ)* පසුපිට අයදුම්පත්‍රයේ දැක්වෙන තොරතුරු 6 වන අතුරු ව්‍යාවස්ථාවේ පරිදි ලේඛනයේ සටහන් කරන ලදී.

*(ඇ)* 20.................... දින, අංක......................... දරන ලදුපත මගින් රු. ......................... ක් අයකර ගෙන ඇත.

(ඈ) මේ අවසර පත්‍රයේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 10 වන අතුරු ව්‍යවස්ථාවේ පරිදි අදාළ ලේඛනයේ සටහන් තැබීමෙන් අනතුරුව මෘත දේහය ආදහනය කිරීමට ක්‍රියා කරන්න.

(ඉ) අවසරපත් ලේඛනයේ අනුක්‍රමික අංකය .........................වේ.

.........................
සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය : 20........................

*දෙවන උපලේඛනය*

*5 වැනි වගන්තිය*

.........................
අනුක්‍රමික අංකය
(ඉදිරි පිටුව)

(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය.)

**.................. ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම**

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :..........................................................
ලිපිනය :..........................................................
ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................
ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම :..........................................................

2. මියගිය අයගේ සම්පූර්ණ නම :..........................................................
ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................
පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය :..........................................................

ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම :..........................................................
ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය :..........................................................
ඉල්ලුම්කරු අයත්වන ගාස්තු බාණ්ඩ අංකය : [ ]
(ඔබ අයත්වන්නේ ගාස්තු බාණ්ඩ අංක 05 හෝ 06 ට නම්, ඒ බව සනාථ කිරීමට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.)

3. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධය :..........................................................
(තහවුරු කිරීමට 5 වන අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් සහතිකයක් අමුණන්න.)

4. මරණ සහතිකයේ ලියාපදිංචි අංකය හා දිනය :..........................................................
(මරණ සහතිකයේ පිටපතක් අමුණන්න)

5. මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ නම හා කොට්ඨාසය :..........................................................

6. මරණයට හේතුව :..........................................................

7. මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්,
(5 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ දැක්වෙන සහතිකය අමුණන්න)
පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :..........................................................
පරීක්ෂණය පැවැත්වූ දිනය :..........................................................
පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :..........................................................
මෘත දේහය ආදාහනය කිරීමට පරීක්ෂණ නිලධාරියා අවසර දී තිබේ ද ?:......................................

8. ආදහනය කිරීමට ඉල්ලා සිටින දිනය හා වේලාව (කැමැත්තේ අනුපිළිවෙල අනුව)

| දිනය | වේලාව | දිනය | වේලාව |
|---|---|---|---|
| i. 20...................... | පැය :...................... | ii. 20...................... | පැය :...................... |
| iii. 20...................... | පැය :...................... | iv. 20...................... | පැය :...................... |

9. මෘත දේහය ආදහනය කිරීමෙන් පසු භෂ්මාවශේෂ භාර ගැනීමට අපේක්ෂා කරන්නේ ද?......................
(භෂ්මාවශේෂ භාර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් භාජනයක් මෘත දේහය භාර දෙන අවස්ථාවේ දී ආදහනාගාර භාරකරු වෙත භාර දිය යුතුය.)

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාරගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදළ සහතික අමුණා ඇත.

.........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : 20........................................

**තුන්වන උපලේඛනය**

*6 වන වගන්තිය*

**...................................ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘතදේහ ආදාහනය කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍ර ලේඛනය**

නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනය

| අනු. අංකය | ඉල්ලුම්පත්‍රයේ අනුක්‍රමික අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | | | | මහේස්ත්‍රාත්/ හදිසි මරණ පරීක්ෂක නියෝගයේ | | ලදුපතේ | | ආදාහනය සඳහා වෙන් කළ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අංකය | දිනය | නම | මරණකරු වෙත ඇති සම්බන්ධතාවය | ලිපිනය | ජා. හැ. ප. අංකය | යොමු අංකය | දිනය | අංකය | මුදල රු. ශත | දිනය | වේලාව |
| 1 | | | | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | | | | | |
| 5 | | | | | | | | | | | | | | | | | |
| 6 | | | | | | | | | | | | | | | | | |
| 7 | | | | | | | | | | | | | | | | | |
| 8 | | | | | | | | | | | | | | | | | |
| 9 | | | | | | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | | | | | | |

(සැ.යු. .- ලේඛනයේ වම්පස හා දකුණුපස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට තීරුවල ප්‍රමාණවත් ඉඩ කඩක් ඇති කරගත යුතු ය.)

**සිව්වන උපලේඛනය**

*10 වන වගන්තිය*

**.....................................ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ආදාහනය කරන ලද මෘත දේහ පිළිබඳ ලේඛනය**

| අනු. අංකය | ඉල්ලුම්පත්‍රයේ අනුක්‍රමික අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | අවසරපත් ලේඛනයේ අනු. අංකය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | | ලදුපතේ | | ආදාහනය කළ | | භෂ්මාවශේෂ ගෙන ගිය දිනය | ආදාහනාගාර භාරකරුගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | අංකය | දිනය | නම | ජා. හැ. ප. අංකය | අංකය | මුදල රු. ශත. | දිනය | වේලාව | | |
| 1 | | | | | | | | | | | | | | | | |
| 2 | | | | | | | | | | | | | | | | |
| 3 | | | | | | | | | | | | | | | | |
| 4 | | | | | | | | | | | | | | | | |
| 5 | | | | | | | | | | | | | | | | |
| 6 | | | | | | | | | | | | | | | | |
| 7 | | | | | | | | | | | | | | | | |
| 8 | | | | | | | | | | | | | | | | |
| 9 | | | | | | | | | | | | | | | | |
| 10 | | | | | | | | | | | | | | | | |

*(සැ.යු. .- ලේඛනයේ වම්පස හා දකුණුපස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට තීරුවල ප්‍රමාණවත් ඉඩ කඩක් ඇති කරගත යුතු ය.)*

02-784/2

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන
(සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සේරසිංහ ආරච්චිගේ සමන් ප්‍රියන්ත වන මම,

**පෞද්ගලික ඉඩම් කටු පඳුරුවලින් තොරව පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.08.29 දිනැති තීරණ අංක 744 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. එස්. ප්‍රියන්ත,
ලේකම් හා බලතල කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිළධාරී
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 29 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 02 වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ජේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.08.31 දිනැති අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *(අති විශේෂ) ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරනු ලැබුවා වූ පෞද්ගලික ඉඩම් කටු පඳුරු වලින් තොරව පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 03 වන වගන්තියේ සඳහන් විධි විධානවලට අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) වැනි උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

*පෞද්ගලික ඉඩම් කටු පඳුරුවලින් තොරව පවත්වා ගැනීම, විධිමත් කිරීම, පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා*

01. මෙම අතුරු ව්‍යවස්ථා නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති පෞද්ගලික ඉඩම් කටු පඳුරු වලින් තොරව පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

02.නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්නා සියලුම ඉඩම් කටුපඳුරු වලින් තොරව පවත්වාගෙන යාම එකී ඉඩම්වල අයිතිකරුවන්ගේ හෝ පදිංචිකරුවන්ගේ කාර්යය විය යුතු ය.

03. කිසියම් ඉඩමක් කටුපඳුරුවලින් යුක්ත වන්නේ ද යන්න තහවුරු කර ගැනීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියකුට අවශ්‍ය වන අවස්ථාවක ඔහු විසින් පෙරවරු 06.00 ත් පස්වරු 06.00 ත් අතර කාලයේ දී එකී ඉඩමට ඇතුල්වීම, පරීක්ෂා කිරීම නීත්‍යානුකූල වන්නේය. එවැනි කිසියම් පරීක්ෂා කිරීමකට කවර හෝ තැනැත්තකු විසින් බාධා නොකළ යුතු ය.

04. කිසියම් ඉඩමක් කටු පඳුරුවලින් යුක්ත වන බවට සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා සෑහීමට පත්වී ඇති කවර හෝ අවස්ථාවක දී එකී ඉඩම කටු පඳුරුවලින් තොරව තබාගන්නා ලෙසට එකී ඉඩමේ අයිතිකරුට හෝ පදිංචිකරුට ලිඛිතව දැන්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

05. 04 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ආකාරයේ කිසියම් දැන්වීමක් ලැබුණු කවර හෝ තැනැත්තෙකු එකී දැන්වීමේ දින සිට දින දහ හතරක් ගතවීමට මත්තෙන් එකී ඉඩමේ කටු පඳුරු ඉවත්කිරීම කළ යුතු ය. කෙසේ වුව ද අයිතිකරු හෝ පදිංචිකරු විසින් පිළිගතහැකි හේතු ඉදිරිපත් කෙරෙන ලිඛිත ඉල්ලීමක් සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක එකී කාර්යය සඳහා නියම කරන ලද කාලය ඉහත කී දැන්වීමේ දින සිට දින 30ක උපරිමයකට යටත්ව දීර්ඝ කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් කරනු ලැබිය හැකි ය.

06. කිසියම් ඉඩමකින් ඉවත් කරනු ලැබූ කටු පඳුරු හෝ කටුපඳුරුවල කොටස් පොදු ස්ථානයකට දැමීම නොකළ යුතු අතර වෙනත් යම් තැනැත්තකුට අයත් ඉඩමකට එකී තැනැත්තාගේ අවසරයකින් තොරව දැමීම ද නොකළ යුතුය.

07. මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ අතුරු ව්‍යවස්ථාවක දැක්වෙන නියමයන් හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් විය යුතුය. එකී කිසියම් වරදක් සම්බන්ධව නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

08. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ අතුරු ව්‍යවස්ථාවල

"අයිතිකරු හෝ පදිංචිකරු" යන්නෙන් නිකවැරටිය ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල ඇති කිසියම් ඉඩමක නීත්‍යානුකූල අයිතිකරු හෝ ඒ ඉඩමේ පදිංචි යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් අදහස් වන අතර රජයට අයත් යම් ඉඩමක්, ගිවිසුමක් යටතේ බද්දට හෝ කුලියට ගෙන සිටින යම් තැනැත්තෙකුද ඇතුළත් විය යුතු අතර යම් පෞද්ගලික ඉඩමක් බද්දට හෝ කුලියට ගෙන ඇති තැනැත්තකු ද ඇතුළත් විය යුතුය. "කටුපඳුරු" යන්නෙන්, කිසියම් තැනැත්තකුගේ පාලනයකින් තොරව පොළොව මට්ටමෙන් සෙන්ටිමීටර් 20 කට වඩා උසින් යුතුව ඉබේ වැවෙන කිසියම් ශාකයක් හෝ ශාක වර්ගයක් අදහස් වන අතර අලංකාර පිණිස වවනු ලබන කිසියම් මල් පඳුරක් හෝ ආර්ථික හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා වවනු ලබන හෝ ඉබේ වැවෙන කිසියම් ශාකයක් හෝ භෝග වර්ගයක් ඇතුලත් නොවිය යුතුය.

"පොදු ස්ථානය" යන්නෙන් කිසියම් මාර්ගයක්, මංමාවත්, වීථියක්, පටු මගක්, දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක්, මාර්ගරක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසාන භූමියක්, බස්නැවතුම්පොලක්, දුම්රිය ස්ථානය, ගඟක්, ඇලක්, දොලක්, වැවක්, පොකුණක්, කලපුවක්, දිය කඩිත්තක්, දිය පහරක්, වැසි ජල කාණුවක්, මුහුදු වෙරළක්, සභාව සතු යම් ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන් කර ඇති රජය සතු යම් ඉඩමක් හෝ මහජනයාගේ පොදු පරිහරණයට වෙන්කළ වෙනත් ඕනෑම ස්ථානයක් අදාළ වන්නේ ය.

"බලයලත් තැනැත්තා" යන්නෙන් තත්කාර්යය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ නිලධාරියකු ද,

"සභාව" යන්නෙන්, නිකවැරටිය ප්‍රාදේශීය සභාව ද,
අදහස් විය යුතුය.

01-784/3

---

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සේරසිංහ ආරච්චිගේ සමන් ප්‍රියන්ත වන මම,

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව**

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.08.29 දිනැති තීරණ අංක 744 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. එස්. ප්‍රියන්ත,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 29 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරණ පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 02 වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ, වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.08.31 දිනැති අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අති විශේෂ) *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරනු ලැබුවා වූ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම හා ගාස්තු අය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාවේ 1952 අංක 06 දරන පළාත් පාන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 03 වන වගන්තියේ සඳහන් විධි විධාන වලට අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) වැනි උපවගන්තියෙහි විධිවධාන ප්‍රකාරව මා තීරණය කරමි.

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව**

01. මේ අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ඇති අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. *(අ)* මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුව පිළියෙල කළ ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කළ අයදුම් පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කර ලබාගත් ඔහුගේ අත්සන සහිත බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කිසියම් තැනැත්තකු විසින් බල ප්‍රදේශය ඇතුළත අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම නීත්‍යානුකූල නොවන්නේ ය.

*(ආ)* මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක් ම, සභාපතිවරයා විසින් මේ වගන්තිය යටතේ කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින අවසන් විය යුතු අතර, එකී බලපත්‍රය අන් අයකුට පැවරිය නොහැකි විය යුතු ය.

03. සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වාගෙන යනු ලබන අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා සභාව විසින් කළින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් අයකළ හැකි අතර, එකී ගාස්තු ප්‍රමාණය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබිය යුතු ය.

04. කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක හිමිකරු විසින් මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයක් හෝ නියමයන් පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් කළ විට, එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පවත්වාගෙන යාමට නිකුත් කළ බලපත්‍රය මහා සභාවේ තීරණය මත සභාපතිවරයා විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

05. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ ඇතුළත මෘත දේහ සැකසීම පිණිස වෙන්වූ කාමරයක් තිබිය යුතු අතර, එකී කාමරයේ එක් පුද්ගලයකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග අඩි අසූවකට නොඅඩු ඉඩ කඩක් තිබිය යුතු ය. එසේම එකී කාර්යය කිරීමට භාවිත කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු වන අතර එය පිඟන් ගඩොලින් බැඳ මනා නිමාවකින් පැවතිය යුතු ය.

06. *(අ)* අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන ආරම්භ කිරීමට පෙර පළාත් පරිසර අධිකාරියෙන් නිකුත් කරනු ලබන නිරවුල් සහතිකය ලබාගත යුතු අතර අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම සඳහා වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමත් කළ යුතු ය.

*(ආ)* දැනට ආරම්භ කර ඇති අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන සඳහා ප්‍රාදේශීය සභාව වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීමෙන් අනතුරුව එළඹෙන වර්ෂයේ සිට වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමත් කළ යුතු ය.

07. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතාශ්‍රය ලැබෙන පරිදි භාවිත කාමරයේ වර්ගඵලයෙන් හතෙන් එකකට නොඅඩු ප්‍රමාණයකට වූ වාතයට විවෘත වන කවුළු සකසා තිබිය යුතු අතර, ඒ පිළිබඳ කාර්යයන්හි නියුක්තවීම කිසිදු බාහිර පුද්ගලයකුට නොපෙනෙන ආකාරයෙන් තිබිය යුතු ය. එකී කවුළු අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පිහිටි පරිශ්‍රයේ ආසන්න ඉඩම්වල ඇති පදිංචි හෝ පවත්වාගෙන යන කාර්යාල පරිශ්‍ර දෙසට එක එල්ලේ විවෘත නොවී තිබිය යුතු ය.

08. මෘත දේහයක් සැකසීම කිරීමේ දී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු අතර, එකී කාර්යය කරන අවස්ථාවේ දී මෘත ශරීරයෙන් බැහැරවන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහය සේදීම කරනු ලබන්නේ නම් එකී අප ජලය රැස්කර ගැනීම සඳහා සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ භාජන තබා තිබිය යුතු ය. එකී භාජන

අපාරගම්‍ය, අපාරදෘශ්‍ය හා මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තිබිය හැකි ඒවා විය යුතු ය.

09. මෘත දේහයක් සැකසීමේ දී ඉවත් කරනු ලබන හෝ ඉවත්වන මෘත ශරීර කොටස්, මහෙස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු හෝ විසින් ඒ පිළිබඳව ලබා දී ඇති නියෝගයක් නොමැති නම්, එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හයක් ගතවීමට මත්තෙන් පොළොවේ මතු පිට සිට අඩි හතරක් ගැඹුරු වලක වල දමා මැනවින් වසා දැමිය යුතු ය. එවැනි නියෝගයක් ඇත්තේ නම්, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හිමිකරු විසින් ඒ අනුව ක්‍රියා කිරීම කළ යුතු ය.

10. ඉහත 9 වන වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටක, සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය ප්‍රාදේශීය සභාවේ පොදු සුසාන භූමියේ ඇතුළත, ඉහත කී ගැඹුරින් යුතුව වල දමා වසා දැමිය යුතු ය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරය සෑම විටම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හෝ ශාලාවලින් වෙන්වී තිබිය යුතු අතර, සේවකයකු නොවන කිසිම බාහිර පුද්ගලයකුට අවසරයකින් තොරව ඇතුළුවීමට නොහැකි විය යුතු ය.

12. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය නිරන්තරයෙන් විෂබීජනාශක යොදා පිරිසිදුව පවත්වා ගැනීම සිදු කළ යුතු ය. එසේම අවශ්‍ය අවස්ථාවක දී කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සඳහා ප්‍රයෝජනයට ලබා ගත හැකි වන පරිදි එකී ස්ථානයේ ප්‍රමාණවත් ප්‍රථමාධාර හා වෙනත් අවශ්‍ය උපකරණ තිබිය යුතු ය.

13. මෘත දේහය සැකසීම කරනු ලබන පරිශ්‍රය තුළ මෘත දේහය සැකසීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය හා උපකරණ හැර ශබ්දය හෝ රූපය පටිගතකළ හැකි හෝ ඡායාරූපගත කළ හැකි කිසිදු උපකරණයක් භාවිතා කිරීම වරදක් වන්නේ ය.

14. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් පිළිබඳව වාර්තා පවත්වා ගැනීම හිමිකරු විසින් කළ යුතු අතර, මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල කටයුතු කරන සියලුම සේවකයන් සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ ඇඳුම් හා ආරක්ෂිත වැසුම් පැළඳ සිටිය යුතු අතර එකී කාමර තුළ ආහාර හෝ පාන කිසිවක් සැපයීම හෝ භාවිතා කිරීම කරනු නොලැබිය යුතු ය.

15. මෘත දේහ ගෙනයනු ලබන රථවල ඇතුළත නිරන්තරයෙන්, රක්ත ශෝධක මගින් පිරිසිදු කර, විෂබීජ නාශක යොදා තිබිය යුතු ය.

16. අධික වශයෙන් තුවාල සිදුවීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතීන් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිත නොකළ යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබා ගෙන ඇති අයකු හෝ එවැනි බලපත්‍රධාරියකු විසින් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු හෝ හැර, වෙනත් අයකු විසින් කිසියම් මෘත දේහයක් සැකසීම හෝ මෘත දේහයක් ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

18. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ කළමනාකරු මෙම ආයතනය විවෘත කර ඇති වේලාව තුළ සිදුවන සියලු කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර, ඔහු සේවා ස්ථානයේ පෞද්ගලිකව නොමැති අවස්ථාවක් වේ නම් එවැනි අවස්ථාවකට බලයලත් නිලධාරියකුට ලිඛිතව පත් කිරීම කළමනාකරුගේ වගකීම වන්නේ ය.

19. කවර හෝ බලපත්‍රධාරියකු විසින් කොළරාව, මහාමාරිය, වසූරිය, කහ උණ රෝගයෙන් මියගොස් ඇති බවට සැළකෙන අයකුගේ මෘතදේහයක්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් ඒ සඳහා බලපත්‍රධාරියාට දෙන ලද ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස, බලපත්‍රලත් ස්ථානය වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩ දීම නොකළ යුතු ය.

20. කිසියම් මෘත දේහයක් සැකසීමට හා අවමංගල්‍ය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් හෝ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41.1 (ආ) වගන්තිය යටතේ නිකුත් කරන ලද මරණ දැන්වීමක් හෝ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන B - 24 ආකෘතියක් තමා වෙත ඉදිරිපත් කළහොත් මිස, එකී කාර්යයන් සඳහා මෘතදේහයක් භාර ගැනීම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක හිමිකරු විසින් නොකළ යුතු ය.

21. කිසියම් මෘත ශරීරයකට අදාළ මරණය හදිසි මරණයක් වනවිටක හෝ එකී මරණය සැක සහිත වනවිටක, මහේස්ත්‍රාත්වරයකු විසින් හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු විසින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම්, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හිමිකරු විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපැදිය යුතු ය.

22. ස්වකීය අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ දී හෝ තම ආයතනය විසින් වෙනත් බලපත්‍රලාභී බාහිර ස්ථානයක දී හෝ සිදුකරනු ලබන සෑම මෘතදේහ සැකසීමක්ම හා අවමංගල්‍ය සේවා සැපයීම් සම්බන්ධව මෙහි දෙවැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කළ අයදුම්පත්‍රයක් සේවා ලාභියාට ඉදිරිපත් කර අදාළ තොරතුරු ලබාගත යුතු අතර, ඊට අදළව මෙහි තෙවැනි උපලේඛනයෙහි දැක්වෙන ආකෘතියට අනුකූලව පිළියෙල කරගත් තොරතුරු ලේඛනයක් එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හිමිකරු විසින් පවත්වාගත යුතු අතර එකී ලේඛනය ඉල්ලා සිටි අවස්ථාවක දී සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියකුට ඉදිරිපත් කළ යුතු ය.

23. මහජන ගෞරවය පිණිස මෘතදේහ තබා ගැනීමේ සේවාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් සම්බන්ධයෙන් වනවිට, එකී ස්ථානයේ තැන්පත් කර තබන මෘත දේහයට හෝ දේහයන්ට හා එහි භාරකරුවන්ට නිසි ගෞරව ලැබෙන අයුරින් ප්‍රදර්ශනය කළ යුතු ය. එසේම අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන අයගේ පහසුව පිණිස ප්‍රමාණවත් තරමේ ආසන පැනවීමටත්, එසේ පැමිණෙන අයගේ වාහන නැවතීමට ප්‍රමාණවත් ඉඩකඩ ප්‍රමාණයක් සැළසීමටත් වැසිකිළි සහ කැසිකිළි පහසුකම් සැළසීමටත් ඒ ස්ථානය සභාපතිවරයා විසින් කරනු ලබන නියමයන්ට අනුකූලවන පරිදි පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමත් කළ යුතු ය.

24. ගෞරවය සඳහා මෘත දේහයන් තැන්පත් කර තැබීමේ ස්ථානය, ඒ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හා මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයෙන් වෙන්වී පවත්වාගෙන යා යුතු ය.

25. බලපත්‍රධාරියකු විසින් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ අවට අසල්වාසීන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කිසිදු කාර්යයක් නොකිරීමට වග බලා ගත යුතු ය.

26. කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක ස්වාභාවික මල් තබා ගැනීම හෝ විකිණීම සඳහා තබාගනු ලබන විට එමගින් ඉවතලන කොටස් බැහැරලීම සභාපතිවරයා විසින් සෑහීමකට පත්වන ආකාරයෙන් කළ යුතු ය.

27. ඉහත 26 වැනි වගන්තියේ පරිදි ක්‍රියා කළ නොහැකිවන විට, එකී කොටස් ඉවත් කිරීමට සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව සභාවේ කිසියම් කසල රඳවනයකට හෝ රැස් කිරීමේ වාහනයකට හෝ සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් බැහැර කළ යුතු ය.

28. ඉහත 26 වැනි වගන්තියේ සඳහන් මල් හෝ ශාක කොටස් කම්බි, කෘත්‍රිම මල්, පොලිතීන් හෝ වෙනත් ඉවතලන දේ කිසියම් මාර්ගයකට හෝ මාර්ගයක් ඔස්සේ ඇති කාණුවකට හෝ වෙනයම් පොදු ස්ථානයකට දැමීම වරදක් වන්නේ ය.

29. සභාපතිවරයා විසින්, මේ අතුරු ව්‍යවස්ථාවේ ඔහුට පැවරී ඇති බලතල හා කාර්යයන් ප්‍රාදේශීය සභාවේ කිසියම් නිලධාරියකුට ලියවිල්ලකින් පවරා දෙනු ලැබිය හැකි ය.

30. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි ඒ ආකාරයෙන් පරීක්ෂාකර බැලීම පිණිස, සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියකුට සතියේ ඕනෑම දිනයක, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය විවෘත කර පවත්වාගෙන යන බවට පළමුවැනි උපලේඛනයෙහි සඳහන් කර ඇති වේලාව තුළ දී, බල ප්‍රදේශය ඇතුළත පිහිටි ඕනෑම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයකට ඇතුළුවීමට ද පරීක්ෂා කිරීමට ද බලය ඇත්තේ ය.

31. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එකී ස්ථානය මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය වන ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන බවට ඒත්තුගෙන ඇත්නම්, එකී උල්ලංඝනය කිරීම් නිශ්චිත කාලයක් ඇතුළත නිවැරදි කරන ලෙසට ඔහු විසින් එකී ස්ථානයේ හිමිකරු වෙත නිවේදනයකින් දන්වා සිටීම නීත්‍යානුකූල වන්නේ ය.

32. 31 වැනි වගන්තියේ සඳහන් නිවේදනය, එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හිමිකරු වෙත අතින් භාර දීමෙන් හෝ එකී ස්ථානයේ අලවා තැබීමෙන් ම, එකී නිවේදනය නිවැරදි ආකාරයෙන් භාරදුන් බවට පිළිගනු ලබන්නේ ය.

33. 31 වැනි වගන්තියේ සඳහන් නිවේදනය ලැබූ සෑම තැනැත්තෙක් ම එකී නිවේදනයේ නියමකර ඇති කාලය ඇතුළත එහි නියමයන්ට අනුව ක්‍රියා කළ යුතු ය.

34. යම් තැනැත්තකු විසින් 31 වැනි වගන්තියේ සඳහන් නිවේදනය ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පවත්වාගෙන යාමට නිකුත් කළ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කළ යුතු අතර, එසේ කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

35. මෙම අතුරු ව්‍යවස්ථාව සහ අදාළ සේවා සැපයුම් ස්ථානයෙන් සපයනු ලබන සේවාවන්ගේ විස්තර ඇතුළත් මිල දර්ශනයක් අදාළ සේවා සැපයුම් ස්ථානයේ පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කළ යුතු ය.

36. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ වගන්තියක දැක්වෙන නියමයන් හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් විය යුතු ය. එකී කිසියම් වරදක් සම්බන්ධව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් ප්‍රදේශයේ මහෙස්ත්‍රාත් අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ-

''අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය'' යන්නෙන්, කිසියම් මෘත ශරීරයක් කල් තබා ගත හැකිවන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙනයනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞරවය පිණිස තබා තිබෙන ස්ථානයක් ද,

''සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී'' යන්නෙන්, නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන සේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් පත්කරනු ලැබ ඇති සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ද,

''බල ප්‍රදේශය'' යන්නෙන්, නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය ද,

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් වූ කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති යම් පුද්ගලයකු ද,

''මෘත ශරීර කොටස්'' යන්නෙන්, මියගිය පුද්ගලයකුගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැරවන හෝ බැහැර කරන ලේ හෝ වෙනත් යම් දියරයක් හෝ මියගිය අය ඒ අවස්ථාවේ දී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක් හෝ මියගිය අයගේ ශරීරයේ තිබූ කිසියම් තුවාලයක හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ශරීර අභ්‍යන්තරයේ තිබූ හෝ තිබෙන වෙලුම් පටි, පුළුන් හෝ වෙන යම් ද්‍රව්‍යයක් ද,

''සභාපතිවරයා'' යන්නෙන්, නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

''සභාව'' යන්නෙන්, නිකවැරටිය ප්‍රාදේශීය සභාව ද,

''සැකසීම'' යන්නෙන්, මියගිය පුද්ගලයකුගේ මෘත දේහයක් අවසන් ගෞරව පිණිස කල් තබා ගත හැකිවන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම, මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍යවන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම ද,

''හිමිකරු'' යන්නෙන්, කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක අයිතිකරු හෝ එකී ස්ථානයේ කළමනාකරු හෝ ඒ අවස්ථාවේ එකී ස්ථානයේ භාරකරු හෝ එකී ස්ථානය පවත්වාගෙන යන යම් තැනැත්තෙක් ද,

අදහස් වේ.

''පොදු ස්ථාන'' යන්නෙන් කිසියම් මාර්ගයක්, මංමාවතක්, වීථියක්, පටුමගක් දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක්, කිසියම් රක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසාන භූමියක්, බස් නැවතුම් පළක්, දුම්රිය ස්ථානයක්, ගංගාවක්, ඇලක්, දෙලක්, වැවක්, පොකුණක්, කලපුවක්, දිය කඩිත්තක්, දිය පහරක්, වැසි ජල කාණුවක්, මුහුදු වෙරළක්, සභාව සතු යම් ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන්කර ඇති රජය සතු ඉඩමක් හෝ මහජනයාගේ පොදු පරිහරණයට ලක්වන වෙනත් ඕනෑම ස්ථානයක් අදළ වේ.

38. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

*උපලේඛන අංක 01*

*02 වැනි වගන්තිය (i) අනුඡේදය*

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාමට කරනු ලබන ඉල්ලීම**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ——————.
02. ලිපිනය : ——————.
03. ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය : ——————.
04. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ව්‍යාපාරික නාමය සහ එකී ස්ථානයේ ලිපිනය : ——————.
05. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පවත්වාගෙන යන ස්ථානයේ වරිපනම් අංකය : ——————.
06. එක වරකදී සැකසීම පිණිස තබා ගත හැකි මෘත දේහ සංඛ්‍යාව : ——————.
07. ආයතනය සතු අවමංගල රථ සංඛ්‍යාව සහ ලියාපදිංචි අංක : ——————.
08. මෘත දේහ සැකසීමට පෙර ප්‍රවාහනය පිණිස යොදවා ඇති වාහන සංඛ්‍යාව : ——————,
09. ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් අපහරණය කරනු ලබන ආකාරය : ——————,
10. පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන තිබේ ද : ——————,
11. අතුරු ව්‍යවස්ථාවෙහි 05 සහ 07 වගන්ති සපුරා තිබේ ද : ——————,
12. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය විවෘත කර පවත්වාගෙන යනු ලබන වේලාව : ——————,
13. ගෞරව පිණිස මෘත දේහ තැන්පත් කර තැබීම භාර ගනු ලබන්නේ නම් : ——————,
    (i) එකවර තැන්පත් කර තැබිය හැකි මෘත දේහ සංඛ්‍යාව : ——————,
    (ii) ගෞරව දැක්වීමට පැමිණෙන අයගේ වාහන කොපමණ ප්‍රමාණයක් එකවර නවතා තැබිය හැකි ද : ——————,
14. ස්වභාවික මල් තබා ගැනීම හා විකිණීම කරනු ලබන්නේ ද ? : ඔව් / නැත
15. ඉවතලන ස්වාභාවික මල් හෝ ශාක කොටස් ඉවත් කරනු ලැබීමට අපේක්ෂා කරන ආකාරය : ——————,
16. ආයතනයේ සේවය කරන ස්ථිර සේවක සංඛ්‍යාව : ——————,
17. කළමනාකරුගේ :
    (i) නම : ——————,
    (ii) ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය : ——————,
    (iii) ලිපිනය : ——————,
    (iv) දුරකතන අංකය : ——————,

18. ....................ප්‍රාදේශීය සභාවේ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමටත් හා කලින් කල ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන වෙනත් සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළිපැදීමටත් එකඟ වන බව මෙහි පහත අත්සන් කිරීමෙන් ම පිළිගනිමි.

.................................... ,
අයදුම්කරුගේ අත්සන.

දිනය : ......................

---

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

1. මෙම අයදුම්පතෙහි සඳහන් කරුණු සත්‍ය බවත්, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාමට කරනු ලබන ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවත් නිර්දේශ කරමි.

2. පහත දැක්වෙන හේතු මත අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාමට කරනු ලබන ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

(i) ...................................................................
(ii) ...................................................................
(iii) ..................................................................
(iv) ...................................................................
(v) ...................................................................

අයදුම්පත පරීක්ෂා කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ -

නම : ..............................................................
අත්සන : ......................................................
දිනය : ...........................................................

*උපලේඛන අංක 02*

*22 වන වගන්තිය*

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය සඳහා භාරදෙනු ලබන මෘතදේහ පිළිබඳ විස්තර ඇතුළත් කිරීමේ ආකෘති පත්‍රය**

01. මියගිය අයගේ නම : ——————,
02. ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය : ——————,
03. ස්ත්‍රී පුරුෂ භාවය : ——————,
04. මියගිය දිනය : ——————,

05. මරණ සහතිකය ලියාපදිංචි කළ -
    (i) දිනය : ——————,
    (ii) අංකය : ——————,

06. මෘත දේහය භාරදුන් -
    (i) දිනය : ——————,
    (ii) වේලාව : ——————,

07. මෘත දේහ භාරකරුගේ :-
    (i) නම : ——————,
    (ii) මියගිය අයට ඇති සම්බන්ධය : ——————,
    (iii) ලිපිනය : ——————,
    (iv) ජාතික හැඳුනුම්පත් අංකය : ——————,
    (v) දුරකථන අංකය : ——————,

08. හදිසි මරණ පරීක්ෂක මහෙස්ත්‍රාත් නියෝගයේ -
    (i) යොමු අංකය : ——————,
    (ii) දිනය : ——————,

ඉහත සඳහන් කරුණු සත්‍ය බව සහතික කරමි.

දිනය : 20 ........................

.........................................,
භාරකරුගේ අත්සන.

*උපලේඛන අංක 03*

*44 වන වගන්තිය*

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ සැකසීම කරන මෘත දේහ පිළිබඳ විස්තර ලේඛනය**

අවමංගල්‍ය සේවා සැපයුම් ආයතනයේ නම .......................................................................................................................................

ලිපිනය ...........................................................................................................................................

| අනු අංකය | අනුක්‍රමික අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | මියගිය දිනය | මරණ සහතිකය ලියාපදිංචි කළ | | මෘත දේහය භාරගත් | | භාරකරුගේ | | | | හදිසි මරණ පරීක්ෂක/ මහේස්ත්‍රාත් නියෝගයේ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අංකය | දිනය | දිනය | වේලාව | නම | මියගිය අයට ඇති සම්බන්ධය | ලිපිනය | ජා. හැ. ප. අංකය | යොමු අංකය | දිනය |
| 1. | | | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | | | | |
| 5. | | | | | | | | | | | | | | | |

(සැ.යු. : ලේඛනයේ වම් පස හා දකුණු පස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට තීරුවල ප්‍රමාණවත් ඉඩ කඩක් ඇති කරගත යුතු ය.)

01-784/4

**නිකවැරටිය ප්‍රදේශීය සභාව**

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතනය (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) උප වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රදේශීය සභාවේ ලේකම් සේරසිංහ ආරච්චිගේ සමන් ප්‍රියන්ත වන මම,

**ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

නිකවැරටිය ප්‍රදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.10.26 දිනැති තීරණ අංක 82 දරන තීරණ යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. එස්. ප්‍රියන්ත,
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිළධාරී,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2016 ඔක්තෝබර් මස 26 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 02 වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) ඡේදයේ සමඟ කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ, වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.08.31 දිනැති අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *(අති විශේෂ) ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පලකරනු ලැබුවා වූ ප්‍රදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 03 වන වගන්තියේ සඳහන් විධි විධාන වලට අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) වැනි උප වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

***ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව***

1. මෙම අතුරු ව්‍යවස්ථාව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. *(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කාරක සභාවන් සහ ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා වන කාරක සභා ඇති කිරීම සහ එකී කාරක සභා සඳහා සාමාජිකයන් පත් කිරීම ප්‍රාදේශීය සභාවක් විසින් කරනු ලැබිය හැකිය.

*(ආ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් පහත සඳහන් කාර්යයන් සඳහා වන කාරක සභා හතරක් ඇති කිරීම ප්‍රාදේශීය සභා කාර්යය විය යුතු ය.

(i) මුදල් හා ප්‍රතිපත්ති සැකසීම,
(ii) නිවාස සහ ප්‍රජා සංවර්ධනය,
(iii) කාර්මික සේවා,
(iv) පරිසරය සහ පහසුකම්.

3. ඉහත 2 වන වගන්තියේ සඳහන් ආකාරයට පත් කරනු ලබන එක් එක් කාරක සභාවේ සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

*(අ)* ප්‍රාදේශීය සභාවේ සභික සංඛ්‍යාවෙන් 1/3කට නොඅඩු සභික සංඛ්‍යාවක් හා
*(ආ)* අවම වශයෙන් කාරක සභාවට අදළ වන විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ප්‍රවීණත්වය දක්වන සහා බල ප්‍රදේශය තුළ පදිංචි තැනැත්තන් තිදෙනක් හා

(ඇ) ඉහත (අ) හා (ආ) හි සංඛ්‍යාව සමග ගත් කල 25% ක නියෝජනයක් ඇතිවන පරිදි ප්‍රදේශයේ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන කාන්තාවන් සඳහා අවම අවස්ථාව සැලසිය යුතුය.

(ඈ) 3 (ඇ) හි කුමක් සඳහන් වුවද ප්‍රමාණවත් කාන්තාවන් සංඛ්‍යාවක් නොවුනහොත් ඉදිරිපත් වන සාමාජිකයින් මගින් එය කළ හැකිය.

4. (අ) 3 වන වගන්තියේ සඳහන් සාමාජිකයන් පත් කිරීම සඳහා වාර්ෂිකව දෙසැම්බර් මාසයේ පවත්වනු ලබන මහා සභා රැස්වීමේදී හෝ ඊට පෙර යෝජනා සම්මුතියකින් තෝරා පත්කර ගත යුතුය.

(ආ) ඉහත 4 (අ) වගන්තිය අනුව සාමාජිකයන් තෝරාපත් කර ගැනීමට නොහැකි වූයේ නම් ඊළඟට එළඹෙන පළමුවන මහ සභා රැස්වීමේදීම අදාළ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම කළ යුතුය.

(ඇ) එක් එක් කාරක සභාවට තෝරා පත්කරගනු ලැබූ කිසියම් සාමාජිකයෙකු ඉල්ලා අස්වීම නිසා හෝ අදළ සාමාජිකයා ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන විට ඔහුගේ ධූරය අවසන් වීම නිසා හෝ සාමාජිකයෙකුගේ මරණය හෝ වෙනත් යම් හේතුවක් නිසා කාරක සභාවේ සාමාජිකත්වය අවසන් වීමෙන් ඇතිවන පුරප්පාඩුවක් සඳහා එම පුරප්පාඩුව ඇති වූ දිනයෙන් පසුව පවත්වනු ලබන ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමකදී වෙනත් යම් සාමාජිකයෙකු තෝරා පත්කර ගැනීම එම සභාවේ කාර්යය විය යුතු ය.

5. (අ) එක් එක් කාරක සභාවට සභාපතිවරයෙකු බැගින් විය යුතු අතර කාරක සභාවේ ප්‍රථම රැස්වීමේදී කාරක සභා සාමාජිකයන්ගේ ඡන්දයෙන් ඔහු තෝරා පත්කර ගත යුතුය.

(ආ) කාරක සභාවේ සභාපති ධූරයට තෝරා පත්කරගනු ලබන තැනැත්තා ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් ඒ අවස්ථාවේ ධූරය දරන තැනැත්තෙකු විය යුතු ය.

(ඇ) කාරක සභාවේ සභාපතිවරයා ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වීම හෝ මියයාම හෝ ප්‍රාදේශීය සභාවේ සභික ධූරයෙන් ඉවත්වීම හේතුවෙන් එකී කාරක සභාවේ ඔහු දරන සභාපති ධූරය අවසන් විය යුතු අතර, එකී සිදුවීමෙන් පසුව එළඹෙන කාරක සභාවේ පළමු රැස්වීමේදී වෙනත් කාරක සභා සභාපතිවරයෙකු තෝරා පත්කර ගැනීම කාරක සභාවේ කාර්යය විය යුතුය.

6. ඉහත 5 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වය හා සභාපති ධූරය නිල බලයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හිමිවිය යුතු ය.

7. කිසියම් කාරක සභා රැස්වීමකට එකී කාරක සභාවේ සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් අතරින්,

(අ) ප්‍රාදේශීය සභාවේ සභිකයින් රැස්වීමට පැමිණ ඇත්නම් ඔවුන් අතුරින් සභිකයෙකු හෝ

(ආ) එම රැස්වීමට ප්‍රාදේශීය සභාවේ සභිකයන් කිසිවකු පැමිණ නොමැති නම් වෙනත් සාමාජිකයන් අතුරින් තැනැත්තකු පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර කැමැත්තෙන් එම කාරක සභා රැස්වීමේ සභාපතිවරයා ලෙස තෝරා පත්කර ගත යුතු ය.

8. (අ) එක් එක් කාරක සභාවේ රැස්වීමේ ගණපූර්ණය ඒ කාරක සභාවට තෝරා පත්කරගනු ලැබූ සාමාජිකයන් සංඛ්‍යාවෙන් අවමය 1/3 විය යුතු අතර, එකී 1/3 සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන විට පූර්ණ සංඛ්‍යාව හා භාගයට ආසන්න ඉහළ සංඛ්‍යාව ගණපූර්ණය විය යුතු ය.

(ආ) යම් කාරක සභාවකට පත්කරනු ලබන සාමාජිකයෙකු අඛණ්ඩව කාරක සභා රැස්වීම් වාර 03ක් සඳහා නොදන්වා සහභාගී නොවී සිටීම එම සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසිවීමට හේතු වන්නේය.

9. (අ) සෑම කාරක සභාවක්ම අවම වශයෙන් මාසයකට එක් වතාවක් බැගින් රැස්වීම් පැවැත්විය යුතු ය.

(ආ) සුවිශේෂී හේතුවක් මත කාරක සභාවේ විශේෂ කාරක සභා රැස්වීමක් පැවැත්විය යුතු යැයි කාරක සභාවේ සභාපතිවරයා අදහස් කරන්නේ නම් ඒ පිළිබඳ සාමාජිකයන් දැනුවත් කිරීමෙන් පසු කිසියම් මාසයක් තුළ කැඳවීම් කළ හැකිය.

(ඇ) කාරක සභාවේ සාමාජිකයන් සම්බන්ධයෙන් 1/3 කට නොඅඩු සංඛ්‍යාවක් විසින් කාරක සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අනුව කාරක සභාවේ විශේෂ සභා රැස්වීමක් කැඳවීම කාරක සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ඇ) යම් රැස්වීමක් පැවැත්වීම නියම කරන දිනට අවමය දින 03කට වත් පෙර සාමාජිකයන් දැනුවත් කිරීම කාරක සභා ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

10. (අ) මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ ලේකම් ධුරය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් දැරිය යුතු ය. ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා නොමැති යම් අවස්ථාවකදී එකී කාරක සභාවේ ලේකම් ධුරය තත්කාලයේ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ කාර්යය හා කර්තව්‍ය ඉටුකරනු ලබන වෙනත් යම් නිලධාරියෙකු විසින් දැරිය යුතු ය.

(ආ) මුදල් හා ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳ කාරක සභාව හැර සෙසු කාරක සභාවන්හි ලේකම් ධුරය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ නිර්දේශය මත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පත් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු වෙත පැවරිය යුතු ය.

11. (අ) එක් එක් කාරක සභාවේ ලේකම්වරයා විසින් එකී කාරක සභාවේ රැස්වීමට සහභාගී වූ සාමාජිකයන්ගේ පැමිණීමේ ලේඛනය පවත්වාගෙන යාම කළ යුතු අතර, කාරක සභාවේ න්‍යාය පත්‍රය මහා සභාවේ න්‍යාය පත්‍රයට අනුරූපි විය යුතු ය.

(ආ) එක් එක් කාරක සභාවේ රැස්වීමේ දී ගනු ලබන තීරණ ඇතුළත් වාර්තාවක් පවත්වාගෙන යාම ඒ ඒ කාරක සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතුය. එය අධීක්ෂණය කිරීම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ වගකීම විය යුතු ය. පසුව එළඹෙන රැස්වීමේ දී ඒ වාර්තාව ස්ථිර කිරීමෙන් අනතුරුව කාරක සභාවේ සභාපති වරයා විසින් ඊට අත්සන් තබා සහතික කළ යුතු ය.

(ඇ) කිසියම් කාරක සභාවක් විසින් යම් කාරණයක් සම්බන්ධයෙන් ගනු ලබන අවසාන තීරණය ප්‍රාදේශීය සභාවේ ඊළඟ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත යොමු කිරීම කාරක සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(ඈ) කිසියම් කාරක කාරණයක් සම්බන්ධයෙන් තීරණයක් ගෙන ක්‍රියා කිරීමට එක් කාරක සභාවකට ප්‍රාදේශීය සභාව විසින් බලය පවරනු ලැබ ඇති යම් කාර්යයක් සම්බන්ධයෙන් ගනු ලබන තීරණ ප්‍රාදේශීය සභාවේ දැන ගැනීම සඳහා සභාගත කළ යුතු අතර, සෙසු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතු ය.

12. කිසියම් කාරක සභාවක රැස්වීමේ දී ගනු ලැබිය යුතු යම් තීරණයක් සඳහා පරීක්ෂා කර බැලීමට අවශ්‍ය සභාව සතු ලිපිගොණු, ලිපිලේඛන සහ පොත්පත් එකී කාරක සභා රැස්වීමට ගෙන්වා ගැනීමට කාරක සභාවට බලය තිබිය යුතු ය.

12. වරිපනම් පැනවීම, බදු පැනවීම, ගාස්තු නියම කිරීම, කිසියම් මුදලක් අයකර ගැනීම හා කිසියම් ණයක් ලබාගැනීම යන කාර්යයන් හැර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති වෙනත් කාර්යයන් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ කාරක සභාවලට පවරනු ලැබිය හැකි ය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ -

"කාරක සභා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන වගන්තියේ සඳහන් කරක සභා ද,
"සභික" යන්නෙන් නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ සභිකයකු ද,
"සභාව" යන්නෙන් නිකවැරටිය ප්‍රාදේශීය සභාව ද,
"ලේකම්" යන්නෙන් නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ ලේකම්වරයාගේ කාර්යය හෝ කර්තව්‍ය ඉටුකරන යම් තැනැත්තෙකු ද,

අදහස් විය යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

01-784/5

## නිකවැරටිය ප්‍රාදේශීය සභාව

### 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සේරසිංහ ආරච්චිගේ සමන් ප්‍රියන්ත වන මම,

**වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බව 2016.10.26 දිනැති තීරණ අංක 82 දරන තීරණය යටතේ මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

එස්. ඒ. එස්. ප්‍රියන්ත,
ලේකම් හා බලතල කාර්යය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
නිකවැරටිය ප්‍රාදේශීය සභාව.

2016 ඔක්තෝබර් මස 26 වැනි දින,
නිකවැරටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 02 වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (02) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.08.31 දිනැති අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළ කරනු ලැබුවා වූ වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 03 වැනි වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුව නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) වැනි උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

**වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මේ අතුරු ව්‍යවස්ථාව "වරිපනම් බදු සහ ගාස්තු පැනවීම, අයකරගැනීම සහ ලබාගැනීමේ කාර්යය සඳහා නිකවැරටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින නිශ්චල දේපළ පිළිබඳ තොරතුරු සහ කර්මාන්ත හෝ ව්‍යාපාර පිළිබඳ වාර වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) නිකවැරටිය ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි කිසියම් නිශ්චල දේපළක් අත්පත් කර ගනු ලබන සෑම තැනැත්තෙකු ම විසින්, එකී නිශ්චල දේපල අත්පත් කර ගනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත

   (ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයෙන් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන කවර හෝ තැනැත්තෙකු විසින් එකී අයදුම්පත්‍රය සමග, නොතාරිස්වරයෙකු විසින් සහතික කරනු ලැබූ පහත සඳහන් ලේඛනවල ඡායාස්ථිතික පිටපත් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

   (I) එකී දේපළෙහි හිමිකම් ඔප්පුව.
   (II) බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් අඳිනු ලැබූ එකී දේපළෙහි ඔප්පුවට අදළ පිඹුරු පත,

   (ඇ) අදළ දේපළෙහි හිමිකම් ඔප්පුව හා ඊට අදළ දින 14ක් ඇතුළත ලබාගත් පත්ඉරු සටහන් අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

3. මේ අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විටත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසියම් නිශ්චල දේපළක් අත්පත් කර ගනු ලැබ ඇති සෑම තැනැත්තෙකු ම විසින්, මේ අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට අවුරුද්දක් ගතවීමට මත්තෙන් 2 වැනි වගන්තියේ නියමකර ඇති ආකාරයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

4. (අ) මේ අතුරු ව්‍යස්ථාවේ නියම කර ඇති ආකාරයට ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියෙකු විසින් තමා සතුව පවතින කවර හෝ නිශ්චල දේපළ සහ හෝ එහි ඇති ගොඩනැගිල්ලක් යොදවනු ලැබ ඇති

කාර්යය වෙනස් කරනු ලැබ ඇත්නම් එකී වෙනස් කිරීම සිදුකර මාසයක් ගතවීමට මත්තෙන් ඒ බව ලේකම්වරයාට ලිඛිත නිවේදනයක් මගින් දන්වනු ලැබීම එකී නිශ්චල දේපළ හිමියාගේ කාර්යය විය යුතු ය.

(ආ) මේ අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයට ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියෙකු විසින් තමා සතුව පවතින කවර හෝ

(I) නිශ්චල දේපළක අනු බෙදුම් පිඹුරක් සකස් කිරීමේ දී,
(II) නිශ්චල දේපළක් වන කිසියම් ඉඩමක් මත අලුතෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පෙර,
(III) නිශ්චල දේපළක් වන කිසියම් ගොඩනැගිල්ලක ආකෘතියේ වෙනසක් වන ආකාරයෙන්

(1) අලුතෙන් කොටසක් එකතු කරනු ලබන්නේ නම්, හෝ
(2) පවතින කොටසක් කඩා ඉවත් කරනු ලබන්නේ නම්, හෝ
(3) පවතින කොටසක් කඩා ඉවත් කර අලුතින් කොටසක් එකතු කරනු ලබන්නේ නම්. හෝ
(4) සම්පූර්ණ ගොඩනැගිල්ල ම කඩා ඉවත් කර වෙනත් ගොඩනැගිල්ලක් ඉදි කරනු ලබන්නේ නම් හෝ එකී කවර හෝ සිදුවීමක් සිදු කිරීමට පෙර, ඒ සඳහා වන අනුමැතියක් ප්‍රාදේශීය සභාවෙන් ලබාගත යුතු ය.

(ඇ) ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියෙකුගේ ස්ථිර පදිංචි ලිපිනය වෙනස් වී ඇති විටක, එකී වෙනස් වීම සිදුවී දින දහහතරක් ඇතුළත ඒ පිළිබඳව වන ලිඛිත දැන්වීමක් ලේකම්වරයා වෙත භාර දීම එකී නිශ්චල දේපළ හිමියාගේ කාර්යය විය යුතු අතර ඒ ලිඛිත දැන්වීම ලැබුණු වහාම නිශ්චල දේපළ හිමියන් ලියාපදිංචි කිරීමේ ලේඛනය, ඒ අනුව සංශෝධනය කිරීම සහ එසේ සංශෝධනය කරනු ලැබ ඇති බව එකී නිශ්චල දේපළ හිමියාට ලිඛිතව දැනුම් දීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

5. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම් පත්‍රයක්ම සම්බන්ධයෙන් වන නිශ්චල දේපළ හිමියන් හා ඔවුන් සතුව පවතින නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනයක්, මේ කොටසේ දෙවන උපලේඛනයේ ආකෘතියට සාරානුකූලව පිළියෙල කර පවත්වාගෙන යාම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

6. (අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කවර හෝ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් හෝ විකිණීමක් මත හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන යම් බද්දක් හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත අයකරනු ලබන ගාස්තුවක් හෝ අයකර ගැනීමේදී, ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු එකී බද්ද හෝ බලපත්‍ර ගාස්තුව ගණන් බැලීම සඳහා අවශ්‍ය කරන්නා වූ එකී ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ හෝ විකිණීමේ කටයුතු කරගෙන යාමේ දී

(I) කිසියම් වර්ෂයක කාලයක් තුළ ලද ලැබීම් ප්‍රමාණය, හෝ
(II) කිසියම් වර්ෂයක කාලයක් තුළ ව්‍යාපාර පිරිවැටුම, හෝ
(III) කිසියම් වර්ෂයක කාලයක් තුළ උපයනු ලැබිය හැකි ලාභය, හෝ
(IV) කිසියම් විකිණීමක් මගින් ලැබුණු මුදල, හෝ

සාම විනිසුරුවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරියේ සහතික කළ වාර්තාවක් මගින් තහවුරු කරන ලෙස එකී කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ හිමිකරුගෙන් හෝ කළමනාකරුගෙන් ලේකම්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඉල්ලා සිටිනු ලැබිම නීත්‍යානුකූල විය යුතු ය.

(ආ) ලේකම්වරයා විසින් එවනු ලබන (අ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීම තමාට ලැබුණු දින සිට දින දහ හතරක් ඇතුළත් එකී දැන්වීම මගින් ඉල්ලා ඇති වාර්තා ලේකම්වරයා වෙත සැපයීම කළ යුතු ය.

7. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ වගන්තියක දැක්වෙන නියමයන් හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් විය යුතු ය. එකී කිසියම් වරදක් සම්බන්ධව මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයකින් වරදට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකටද යටත් විය යුතු ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ අතුරු ව්‍යවස්ථාවේ

"කළමනාකරු" යන්නෙන් මේ අතුරු ව්‍යවස්ථාවේ අදාළ වන කිසියම් දේපළක, ව්‍යාපාරයක හෝ කර්මාන්තයක නීත්‍යානුකූල අයිතිකරු හෝ එකී අයිතිකරු වෙනුවෙන් පෙනී සිටින වෙනත් කිසියම් නියෝජිතයකු හෝ එකී දේපළ හෝ ව්‍යාපාරය හෝ කර්මාන්තය කළමනාකරණය පවරනු ලැබ ඇති කිසියම් තැනැත්තකු ද,

"නිශ්චල දේපළ" යන්නෙන්, කිසියම් ඉඩමක් සහ හෝ ගොඩනැගිල්ලක් හෝ කිසියම් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් අදහස් විය යුතු ය.

"දේපළ හිමිකරු" යන්නෙන්, කිසියම් නිශ්චල දේපළක තනි අයිතිකරු වන යම් තැනැත්තෙක් හෝ එකී නිශ්චල දේපළ තනි අයිතිකරුවෙකුට වැඩි ගණනක අයිතිකරුවන් සිටින විට ඒ එක් එක් අයිතිකරු වෙන් වෙන්ව හා සාමූහිකව එකී දේපළෙහි හිමිකරු වශයෙන් අදහස් විය යුතු අතර තත් කාලයේ දී එකී දේපළෙහි පදිංචිව සිටින හෝ එකී දේපළෙහි භාරකාරත්වය දරන හෝ වෙනත් කිසියම් තැනැත්තෙකු ද ඊට ඇතුළත් විය යුතු ය.

"ලේකම්වරයා" යන්නෙන්, නිකවැරටිය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද,

"වාර වාර්තා" යන්නෙන් හය වන වගන්තියේ සඳහන් කිසියම් නිශ්චිත කාලයකට අදාළ වර්තා ද,

"සභාව" යන්නෙන්, නිකවැරටිය ප්‍රාදේශීය සභාව ද, අදහස් විය යුතු ය.

**පළමුවන උපලේඛනය**

2 වැනි වගන්තිය (අ) ඡේදය

**........................ ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පවතින නිශ්චල දේපළ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම,**
**(එක් එක් දේපළ වෙනුවෙන් වෙන වෙනම ආකෘති පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතු ය)**

1. (අ) දේපළ හිමිකරුගේ/ හිමිකරුවන්ගේ නම/නම් :
   1. ..............................................................................................
   2. ..............................................................................................
   3. ..............................................................................................

2. (ආ) දේපළ හිමිකරුගේ/ හිමිකරුවන්ගේ ස්ථිර ලිපින(යන්) :
   1. ..............................................................................................
   2. ..............................................................................................
   3. ..............................................................................................

(ඇ) දුරකථන අංකය : ..............................................................

(ඈ) දේපළ පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය හා නම : ..............................................................

(ඉ) දේපළ පිහිටි වීථියේ හෝ ගමේ නම : ..............................................................

(ඊ) වරිපනම් අංකය : ..............................................................

(උ) ඔප්පුවේ අංකය : ..............................................................

(ඌ) භූමි ප්‍රමාණය : අක්කර : ...................... රූඩ් : ......................... පර්චස් : ......................... (හෙක්ටයාර් : .............)

(එ) නොතාරිස් තැනගේ නම සහ ලිපිනය : ..............................................................

2. ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ නම/පත්ඉරු අංකය : ..............................................................

3. (අ) දේපළ ඉඩමක් වන විට එකී දේපල මත කවර හෝ ගොඩනැගිල්ලක් ඉදිකර තිබේද ? ඔව්/නැත

(ආ) පිළිතුර "ඔව්" නම එකී ගොඩනැගිල්ල, තනි ගොඩනැගිල්ලක් ද නැතහොත් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් ද යන වග?

4. දේපළ අත්පත්කර ගනු ලැබූ දිනය: ..............................................................

5. දේපළ පාවිච්චි කරන කාරණය : නේවාසික/වෙළෙඳ හෝ වාණිජ කාර්යය.

6. සභාව අනුමත කළ ගොඩනැගිලි සැලසුමේ අංකය : ................................................................................................................

7. ඉදිරිපත් කරනු ලබන හිමිකම් සහතිකයේ -

(අ) දිනය : ..................................................................................................

(ආ) නොතාරිස්වරයාගේ නම : .......................................................................

(ඇ) නොතාරිස්වරයාගේ ලිපිනය : ..........................................................................

දිනය : .................................................... ....................................................

දේපළ හිමියාගේ අත්සන.

## දෙවන උපලේඛනය

5 වැනි වගන්තිය

**................................ප්‍රාදේශීය සභාව**

නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනය

| ලියාපදිංචි කළ | | දේපළ හිමිකරුගේ | | | | | | | | | | | ඉදිරිපත් කරනු ලබන හිමිකම් සහතිකයේ | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂය හා දිනය | අංකය | නම/නම් | ස්ථිර පදිංචි ලිපිනය/ලිපිනයන් | දේපළ පිහිටි වීථිය/පාර | වරිපනම් අංකය | ග්‍රා.සේ.නි. වසමේ අංකය හා නම | ඉඩමේ ප්‍රමාණය (හෙක්ටයාර්) | පිඹුරේ අංකය | ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ නම/ පත්ඉරු අංකය | නොතාරිස්තැනගේ නම සහ ලිපිනය | ඉඩමක්ද නැතහොත් ගොඩනැගිල්ලක් ද යන බව | ගොඩනැගිල්ලේ නම් අවසර පත්‍රයේ අංකය | දිනය | නොතාරිස්වරයාගේ නම | නොතාරිස්වරයාගේ ලිපිනය | දේපළ අත්පත් කරගත් දිනය | දේපළ පාවිච්චි කරන කාරණය | විෂය භාර නිලධාරියාගේ අත්සන | ලේකම්ගේ අත්සන හා දිනය |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

01-784/6

# විවිධ දැන්වීම්

**මහඔය ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂයේ වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයෙහි නොවැම්බර් මස 01 වැනි දින මා විසින් අංක 33 දරන තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. ප්‍රසන්නලාල්,
ලේකම්,
මහඔය ප්‍රාදේශීය සභාව.

2016 නොවැම්බර් මස 01 වැනි දින,
මහඔය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 148 වැනි වගන්තිය යටතේ මහඔය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මහඔය ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ 2017 වර්ෂයේ පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත කිසියම් වාහනයක් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙකුගෙන්ම එහි II තීරුවේ නිරූපිත බද්දක් පනවා 2017 වර්ෂය සඳහා අය කළ යුතු යැයි ද,

*(ආ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තියේ ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් ම යථෝක්ත 2017 මාර්තු මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයිද තීරණය කරමි.

**උපලේඛනය**

| | *1 වැනි තීරය* | *11 වැනි තීරය (රු. ශ.)* |
|---|---|---|
| 01. | මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක් ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා ම | 25 0 |
| 02. | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා | |
| | *(අ)* වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | *(ආ)* වෙළෙඳ කාර්යය නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| 03. | සෑම කරත්තයක් සඳහාම | 20 0 |
| 04. | සෑම අත් කරත්තයක් සඳහාම | 10 0 |
| 05. | සෑම රික්ෂෝවක් සඳහා ම | 7 50 |
| 06. | සෑම අශ්වයකු, පෝනියකු, කොටළුවකු සඳහා ම | 15 0 |
| 07. | සෑම ඇතෙකු, සඳහාම | 50 0 |

විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන, විල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයෙහි "වෙළඳ කාර්ය" යන්නට, විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළෙඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

01-786/3

**මහඔය ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂයට ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 152 වැනි වගන්තිය යටතේ මහඔය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2016 වර්ෂයෙහි නොවැම්බර් මස 01 වැනි දින මා විසින් අංක 30 දරන තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. ප්‍රසන්නලාල්,
ලේකම්,
මහඔය ප්‍රාදේශීය සභාව.

2016 නොවැම්බර් මස 01 වැනි දින,
මහඔය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

*(අ)* 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි උප වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මහඔය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එම පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මහඔය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2016 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2017 වර්ෂය සඳහා පනවා අය කිරීමට සහ

*(ආ)* (3) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් වන තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2017 මාර්තු මස 31 වැනි දිනට ප්‍රථම මහඔය ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු බව මා විසින් තීරණය කරමි.

***ඉහත කී උපලේඛනය***

| | *1 වන තීරුව*<br>*2016 වර්ෂයේ දී ආදායම* | *11 වන තීරුව*<br>*ගෙවිය යුතු වාර්ෂික බද්ද*<br>*රු. ශත* |
|---|---|---|
| (i) | රු. 6,000 නොඉක්මවූ අවස්ථාවක | කිසිවක් නොමැත |
| (ii) | රු.6,000 ඉක්මවන එහෙත් රු.12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| (iii) | රු.12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| (iv) | රු.18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 300 0 |
| (v) | රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200 0 |
| (vi) | රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

*ඉහත සඳහන් 1 වන තීරය සඳහා වන ව්‍යාපාර පහත පරිදිවේ.*

01. ගෘහ භාණ්ඩ වෙළෙඳසැලක් පවත්වාගෙන යාම
02. දූව ගබඩාවක් පවත්වාගෙන යාම
03. දර අලෙවිසැලක් පවත්වාගෙන යාම
04. රෙදිපිළි අලෙවිසැලක් පවත්වාගෙන යාම
05. සාප්පු බඩු අලෙවිසැලක් පවත්වාගෙන යාම
06. පූජා භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම
07. ස්වර්ණාභරණ අලෙවිසැලක් පවත්වාගෙන යාම
08. ස්වර්ණාභරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

09. විදුලි උපකරණ අලෙවිසැලක් පවත්වාගෙන යාම
10. විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවි සැලක් පවත්වාගෙන යාම
12. ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
13. බුලත් පුවක් තොග වශයෙන් අලෙවිසැලක් පවත්වාගෙන යාම
14. කුඩා ප්‍රමාණයේ බුලත් විට කඩයක් පවත්වාගෙන යාම
15. ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
16. ආයුර්වේද බෙහෙත් බඩු අලෙවිසැලක් පවත්වාගෙන යාම
17. ජංගම දුරකතන අලෙවි සැලක් පවත්වාගෙන යාම
18. ජංගම දුරකතන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. මුද්‍රිත පොත්, පාසල් උපකර හෝ ලිපිද්‍රව්‍ය අලෙවිසැලක් පවත්වාගෙන යාම
20. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
21. දුරකථන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
22. මෝටර් වාහන සඳහා භාවිතා කරන ඔයිල්, ලිහිසි තෙල් වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23. සියලුම වර්ගයේ මෝටර් වාහන අලෙවිසැලක් පවත්වාගෙන යාම
24. සියලුම වර්ගයේ මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
25. සියලුම වර්ගයේ මෝටර් වාහන අමතර කොටස් අලෙවිසැලක් පවත්වාගෙන යාම
26. එළවළු අලෙවිසැලක් පවත්වාගෙන යාම
27. බටහිර ඖෂධ අලෙවිසැලක් පවත්වාගෙන යාම
28. කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම
29. විසිතුරු සතුන්, විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
30. විසිතුරු සතුන්, විසිතුරු භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
31. බිම්මල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. බිම්මල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
33. බීමට ගන්නා ජලය පිරිපහදු කිරීම හෝ අලෙවි කිරීමේ ස්ථානක් පවත්වාගෙන යාම
34. උත්සව භාණ්ඩ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
35. පාවහන් බෑග් වර්ග නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
36. පාවහන් බෑග් වර්ග අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
37. ටයර් ටියුබ් අලෙවිසැලක් පවත්වාගෙන යාම
38. ටයර් ටියුබ් මාරු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
39. සියලුම වර්ගයේ බැනර්, පෝස්ටර්, ස්ටිකර්, කට් අවුට් ඇඳීම හෝ ප්‍රින්ට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
40. වීදුරු කැපීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
41. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වානෙ යාම
42. වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
43. ජෝතිෂ්‍ය සේවාවන් පවත්වාගෙන යාමේ ස්ථානයක් පවත්වාගෙන යාම
44. මූල්‍ය බැංකුවක් පවත්වාගෙන යාම
45. රක්ෂණ සමාගමක් පවත්වාගෙන යාම
46. සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම
47. රියදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
48. පෙට්‍රල්, භූමිතෙල්, ඩීසල් සල් ෂෙඩ් එකක් පවත්වාගෙන යාම
49. පත්තර, සඟරා, අලෙවි සැලක් පවත්වාගෙන යාම
50. බෝතල්, පරණ පත්තර, යකඩ එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
51. අතිරේක පංති පැවැත්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. ඡායා පිටපත් කිරීම, පරිගණක ලිපි සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. වැලි ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. ලොතරැයි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. යකඩ කම්මලක් පවත්වාගෙන යාම
56. පාපැ දි අලෙවිසැලක් පවත්වාගෙන යාම
57. පාපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. සීඩී, වීසීඩී, ඩීවීඩී කැසට්පට අලෙවි හෝ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
59. මගී ප්‍රවාහන රථ සේවාවක් පවත්වාගෙන යාම
60. අයිස් ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. සහල් තොග වශයෙන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. අවමංගල්‍ය කටයුතු හා භාණ්ඩ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

63. සෙල්ලම් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. පැල තවන් කිරීම හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. ප්ලාස්ටික් ඇළුමිනියම් භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම
66. සත්ව ආහාර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. මත්පැන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
68. මී මැසි පාලනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
69. ධාන්‍ය එක්රැස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

01-786/1

---

**මහඔය ප්‍රාදේශීය සභාව**

2017 වර්ෂයට අදළ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තිය යටතේ මහඔය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 වර්ෂයෙහි නොවැම්බර් මස 01 වැනි දින මා විසින් අංක 31 දරන තීරණය ගත් බව මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. ප්‍රසන්නලාල්,
ලේකම්,
මහඔය ප්‍රාදේශීය සභාව.

2016 නොවැම්බර් මස 01 වැනි දින,
මහඔය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147(1) (ආ) ඡේදයෙන් මහඔය ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මහඔය ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2017 වර්ෂයේ දී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධව එම උපලේඛනයෙහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළ යුතු යැයි තීරණය කරමි.

*උපලේඛනය*

| *1 වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|
| *බලය දෙනු ලබන කාර්යය (අතුරු ව්‍යවස්ථා පනවනු ලැබ ඇති කර්මාන්ත)* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන විට* | *වාර්ෂික වටිනාකම රු.750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන විට* |
| | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 1. සිල්ලර බඩු වෙළෙඳ සැලක් පවත්වගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. දුව ඉරුම්හලක් පවත්වාගනෙයාම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. තේ කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. ගල් කොරියක් පවත්වගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. මැටල් ක්‍රෑෂරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

*උපලේඛනය*

| | *1 වැනි තීරුව* | *II වැනි තීරුව* | | |
|---|---|---|---|---|
| | *බලය දෙනු ලබන කාර්යය (අතුරු ව්‍යවස්ථා පනවනු ලැබ ඇති කර්මාන්ත)* | | *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | |
| | | *රු. 750 නොඉක්මවන විට* | *රු.750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන විට* | *රු. 1,500 ඉක්මවන විට* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 7. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ධාන්‍ය වර්ග, කුළුබඩු වර්ග ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පොල් තෙල් සිඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | කුකුල් කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ගව ගාලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ඌරු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ඌරන්, කුකුලන්, ගවයින් ඝාතනය කර මස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සියළුම වර්ගයේ වාහන ටිංකරින් හෝ ප්ලේන්ට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවි සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | රසකැවිලි නිෂ්පාදන, කිරි මනින අලෙවි පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | සිසිල්බීම සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | වඬේ බයිට් නිෂ්පාදනය හෝ අලෙවි සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | වෙල්ඩිං වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | නවාතැන් ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ශීතකල මස්/මාළු අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | සියළුම වර්ගයේ මෝටර්වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | ධාන්‍ය වර්ග, කුළුබඩු වර්ග අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | බත් පාර්සල් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | මී කිරි, යෝගට් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | යකඩ ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | රසකැවිලි නිෂ්පාදනය හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගනෙ යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | කිතුල් පොල් රා නිෂ්පාදන හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | කොන්ක්‍රීට් පෙරසවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | පළතුරු අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | එළවළු අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | බිම්මල් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | බිම්මල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | වීදුරු කැපීමේ හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | අයිස්ක්‍රීම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

01-786/2

## මහඔය ප්‍රාදේශීය සභාව

### 2017 වර්ෂයට සභාව විසින් සපයන භාණ්ඩ හා සේවාවන් සඳහා ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව 2016 නොවැම්බර් මස 01 දින ගන්නා ලද තීරණය අංක යටතේ 2017 වර්ෂයට මහඔය ප්‍රාදේශීය සභාව විසින් සපයනු ලබන භාණ්ඩ හා සේවාවන්වලට අදළ ගාස්තු අයකරීම සඳහා තීරණය කල බව මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. ප්‍රසන්නලාල්,
ලේකම්,
මහඔය ප්‍රාදේශීය සභාව.

2016 දෙසැම්බර් මස 01 වැනි දින,
මහඔය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඒ අනුව පහත සඳහන් ගාස්තු අයකිරීමට තීරණය කරමි.

| *අනු. අංකය* | *කාර්යය* | *ගාස්තු* |
|---|---|---|
| | | *රු. ශත* |
| 01- | පුටු කුලියට දීම (දිනකට එක් පුටුවක්) | 5 0 |
| 1/67 | ජල ටැංකි කුලියට දීම | |
| 02- | පරිසර ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත්‍රයක් | 100 0 |
| 2/37 | රුපියල් | |
| 03- | සුනඛ එන්නත් කිරීම එක් සුනඛයෙක් සඳහා | 50 0 |
| 2/43 | | |
| 04- | මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය (පැයකට) | 4,500 0 |
| 3/25 | J. C. B. යන්ත්‍රය (පැයකට) | 3,200 0 |
| | ට්‍රැක්ටර් රථ පැය මීටර් එකක් සඳහා | 700 0 |
| | ජල බවුසරයක් ප්‍රවාහනය සඳහා කි.මී. 1කට | 200 0 |
| 05- | බිම් කුලී අය කිරීම පැය තුනකට වඩා වැඩි | 1,500 0 |
| 3/26 | බිම් කුලි අය කිරීම පැය තුනකට වඩා අඩු | 500 0 |
| 06- | ලියාපදිංචි කිරීමේ ගාස්තු වීථි රේඛා සහතික | 1,500 0 |
| 3/41 | ත්‍රීවිල් ලියාපදිංචි කිරීමේ ගාස්තු (එකක් සඳහා) | 750 0 |
| | ලොරි ලියාපදිංචි කිරීමේ ගාස්තු (එකක් සඳහා) | 750 0 |
| 07- | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ අයදුම් පත්‍රයක් සඳහා | 100 0 |
| 3/63 | | |
| 08- | රථ වාහන නවතා තැබීමේ ගාස්තු දිනකට | |
| 5/25 | මෝටර් රථ සඳහා | 50 0 |
| | වෑන් රථ/ලොරි රථ සඳහා | 80 0 |
| | බස් රථ සඳහා | 100 0 |
| 5/45 | උණු දිය උල්පත් නැරඹීමේ ප්‍රවේශ පත්‍ර ගාස්තු | 20 0 |
| | දේශීය වැඩිහිටි | 10 0 |
| | දේශීය ළමා | |
| | විදේශීය වැඩිහිටි | 200 0 |
| | විදේශීය ළමා | 100 0 |
| 6/25 | ජලය ප්‍රවාහන ගාස්තු කි. මී. 01ක් සඳහා | 200 0 |
| 6/54 | පුස්තකාල පොත් අස්ථාන ගතවීමේ ගාස්තු | එම ග්‍රන්ථයේ වර්තමානයේ පවතින මිළ අනුව තීරණය කරනු ලැබේ. |

01-786/4

## කාත්තාන්කුඩි නගර සභාව

### තීරණය

### 2017 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කාත්තාන්කුඩි නගර සභාවේ ලේකම් සේහුමදාර් මුහම්මදු සෆී වන මම (255 වන අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 (අ) වන වගන්තිය සමග කියවිය යුතු එම ආඥාපනතේ 184 අ වගන්තියේ -

(අ) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කාත්තාන්කුඩි නගරය තුළ 2017 වසරේ දී පවත්වාගෙන යනු ලබන මෙහි උපලේඛනයේ සඳහන් සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් කර්මාන්ත බද්දක් පනවා අයකිරීමට,

(ආ) (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව එකී උපලේඛනයේ I වන තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක යථෝක්ත බද්ද, එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වන තීරයේ නිරූපිත යම් සීමාවක් ඇතුළත පවතින අවස්ථාවක, අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව විය යුතු යයි ද ,

(ඇ) (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව 2016 දෙසැම්බර් මස 31 වැනි දින පැවැති යම් කර්මාන්තයක් සම්බන්දයෙන් වන අවස්ථාවක යථෝක්ත බද්ද, 2017 අප්‍රේල් මස 1 වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යන තැනැත්තා හෝ තැනැත්තන් විසින් කාත්තාන්කුඩි නගර සභාවට ගෙවිය යුතු යයි විධාන කිරීමට, සහ

(ඈ) 2017 දී ආරම්භ කරනු ලබන සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක එම බද්ද, කර්මාන්තය ආරම්භ කර මාස තුනක් ඉකුත්වීමට ප්‍රථම යථෝක්ත කර්මාන්තය කරගෙන යන තැනැත්තා හෝ තැනැත්තන් විසින් කාත්තාන්කුඩි නගර සභාවට ගෙවිය යුතු යයි විධාන කිරීමට තීරණය කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරය* | | *II වැනි තීරය* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| *අනු. අංකය* | | *රු.750 නොඉක්මවන විට* | *රු.750 ඉක්මවන නමුත් රු.1,500 නොඉක්මවන විට* | *රු.1,500 ඉක්මවන විට* |
| | | *රු.* | *රු.* | *රු.* |
| 01 | නිමි ඇඳුම් සහිත රෙදිපිළි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 02 | නිමි ඇඳුම් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 03 | ඇඳුම් මැසීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 04 | ස්වර්ණාභරණ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 05 | පිටි හෝ සීනි තොග වශයෙන් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 06 | මෝටර් වාහන අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 07 | පා පැදි අමතර කොටස් අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 08 | පා පැදි අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 09 | ගෘහ භාණ්ඩ අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම පවත්වාගෙන යාම | 500 | 750 | 1000 |
| 10 | රූපවාහිනී යන්ත්‍ර අලෙවි කිරීම | 500 | 750 | 1000 |
| 11 | රූපවාහිනී යන්ත්‍ර අමතර කොටස් අලෙවි කිරීම | 500 | 750 | 1000 |

| *I වැනි තීරය* | | *II වැනි තීරය* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| *අනු. අංකය* | | *රු.750 නොඉක්මවන විට* | *රු.750 ඉක්මවන නමුත් රු.1,500 නොඉක්මවන විට* | *රු.1,500 ඉක්මවන විට* |
| | | *රු.* | *රු.* | *රු.* |
| 12 | ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500 | 750 | 1,000 |
| 13 | මැටි භාණ්ඩ අලෙවි කිරීම | 500 | 750 | 1,000 |
| 14 | ඡායා පිටපත් කිරීම | 500 | 750 | 1,000 |
| 15 | වී හෝ සහල් විකිණීම | 500 | 750 | 1,000 |
| 16 | ධීවර ආම්පන්න අලෙවි කිරීම | 500 | 750 | 1,000 |
| 17 | ඇලුමිනියම් භාණ්ඩ අලෙවි කිරීම | 500 | 750 | 1,000 |
| 18 | ඇස් කණ්නාඩි අලුත්වැඩියා කිරීම | 500 | 750 | 1,000 |
| 19 | ඇස් කණ්නාඩි අලෙවි කිරීම | 500 | 750 | 1,000 |
| 20 | භාණ්ඩ කුලියට දීම | 500 | 750 | 1,000 |
| 21 | විසිතුරු භාණ්ඩ අලෙවි කිරීම | 500 | 750 | 1,000 |
| 22 | මහන මැෂින් විකිණීම | 500 | 750 | 1,000 |
| 23 | බිත්තර විකිණීම | 500 | 750 | 1,000 |
| 24 | ක්‍රීඩා උපකරණ විකිණීම | 500 | 750 | 1,000 |
| 25 | කිරි පිටි පැකට්ටු විකිණීම | 500 | 750 | 1,000 |
| 26 | ත්‍රී රෝද රථ අමතර කොටස් විකිණීම | 500 | 750 | 1,000 |
| 27 | ත්‍රී රෝද රථ විකිණීම | 500 | 750 | 1,000 |
| 28 | ත්‍රී රෝද රථ අලුත්වැඩියා කිරීම | 500 | 750 | 1,000 |
| 29 | රන් භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500 | 750 | 1,000 |
| 30 | ප්ලාස්ටික් භාණ්ඩ විකිණීම | 500 | 750 | 1,000 |
| 31 | පරිගණක භාවිතය පුහුණු කිරීම | 500 | 750 | 1,000 |
| 32 | පරිගණක විකිණීම | 500 | 750 | 1,000 |
| 33 | පරිගණක අලුත්වැඩියා කිරීම | 500 | 750 | 1,000 |
| 34 | පරිගණක අමතර කොටස් විකිණීම | 500 | 750 | 1,000 |
| 35 | ජංගම දුරකථන අමතර කොටස් විකිණීම | 500 | 750 | 1,000 |
| 36 | ජංගම දුරකථන විකිණීම | 500 | 750 | 1,000 |
| 37 | ජංගම දුරකථන අලුත්වැඩියා කිරීම | 500 | 750 | 1,000 |
| 38 | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීම | 500 | 750 | 1,000 |
| 39 | ඡායාරූප ගත කිරීම | 500 | 750 | 1,000 |
| 40 | පැදුරු, පෙට්ටි විකිණීම | 500 | 750 | 1,000 |
| 41 | ගොඩනැගිලි උපකරණ කුලියටදීම | 500 | 750 | 1,000 |
| 42 | භාණ්ඩ ප්‍රවාහනය කිරීම | 500 | 750 | 1,000 |
| 43 | සුවඳ විලවුන් විකිණීම | 500 | 750 | 1,000 |
| 44 | සංඛ්‍යාංක මුද්‍රණය කිරීමේ සේවා සැපයීම | 500 | 750 | 1,000 |
| 45 | කණ්ණාඩි විකිණීම | 500 | 750 | 1,000 |
| 46 | ඇලුමිනියම් භාණ්ඩ විකිණීම | 500 | 750 | 1,000 |
| 47 | සිල්ලර බඩු පැකට්කර විකිණීම | 500 | 750 | 1,000 |
| 48 | ශාරීරික අභ්‍යාස කිරීමේ සේවාවක් සැපයීම (උපකරණ සහිතව) | 500 | 750 | 1,000 |
| 49 | මුදල් අයකරන පෞද්ගලික පෙර පාසලක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 50 | ( මුදල් අයකරන) පෞද්ගලික පාසලක් පවත්වාගෙන යාම | 500 | 750 | 1,000 |
| 51 | විදේශීය මුදල් මාරු කිරීම | 500 | 750 | 1,000 |
| 52 | පරණ යකඩ විකිණීම | 500 | 750 | 1,000 |
| 53 | සෝඩා වර්ග විකිණීම | 500 | 750 | 1,000 |

| *I වන තීරය* | | *II වන තීරය* | | |
|---|---|---|---|---|
| | *කර්මාන්තය* | *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම* | | |
| *අනු අංකය* | | *රු.750 නොඉක්මවන විට* | *රු.750 ඉක්මවන නමුත් රු.1,500 නොඉක්මවන විට* | *රු.1,500 ඉක්මවන විට* |
| | | *රු.* | *රු.* | *රු.* |
| 54 | ට්‍රැක්ටර් අලුත්වැඩියා කිරීම | 500 | 750 | 1,000 |
| 55 | බෙහෙත් වර්ග විකිණීම | 500 | 750 | 1,000 |
| 56 | මුහුදු ජීවීන් විකිණීම | 500 | 750 | 1,000 |
